ISSUE 02

2022 / SEPTEMBER

www.facebook.com

www.twitter.com

www.youtube.com





# ක්ෂුද්‍රමූල්‍ය ණය අර්බුදය

VOICE OF CITIZENS

පුරවැසි හඬ

CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்


**06**

**ක්ෂුද්‍රමූල්‍යකරණය ශ්‍රී ලංකාවේ සාර්ව සමාජ ව්‍යසනයකට තුඩු දිය හැකි ආකාරය**

තුසිත සිරිවර්ධන

**20**

**ක්ෂුද්‍රමූල්‍ය බාඳුරා ගොටුවේ සිර වූ ආදිවාසී කාන්තාවෝ**

ලක්මාල් බදුගේ

2022 / SEPTEMBER

ISSUE 02

**සංස්කරණය:**

ලයනල් ගුරුගේ
ජයසිරි ජයසේකර

**පිටු සැකසුම:**

නලින්ද සෙනෙවිරත්න

කවර ඡායාරූපය Nilantha Sanjeewa on Unsplash
අනෙකුත් ඡායාරූප M. Pradeepan - CPA

මෙම ප්‍රකාශනයෙහි අඩංගු ලිපිවල අන්තර්ගත වන අදහස් හා මත ඒවායේ කතුවරුන් සතු වන අතර ඒවා තුළින් අත්‍යවශ්‍යයෙන්ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අදහස් පිළිබිඹු නොවේ.

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන, දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.


**ලිපිනය** : අංක 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.

**දුරකථන** : +94112081384, +94112081385, +94112081386

**ෆැක්ස්** : +94112081388

**විද්‍යුත් තැපැල** : info@cpalanka.org

**වෙබ් අඩවිය** : www.cpalanka.org

**මුහුණුපොත** : www.facebook.com/cpasl

**ට්විටර්** : @cpasl

# පටුන




## 04

**රජයේ මැදිහත්වීම අත්‍යවශ්‍යයි**

කතුවැකිය



## 06

**ක්ෂුද්‍රමූල්‍යකරණය ශ්‍රී ලංකාවේ සාර්ව සමාජ ව්‍යසනයකට තුඩු දිය හැකි ආකාරය**

තුසිත සිරිවර්ධන



## 20

**ක්ෂුද්‍රමූල්‍ය බාඳුරා ගොටුවේ සිර වූ ආදිවාසී කාන්තාවෝ**

ලක්මාල් බදුගේ



# රජයේ මැදිහත්වීම අත්‍යවශ්‍යයි

ක්ෂුද්‍රමූල්‍ය ණය ක්‍රමය යනු ආසියානු සහ අප්‍රිකානු කලාපයේ නොයෙක් රටවල දිළිඳු ජනයා නගාසිටුවීම සඳහා යොදාගැනෙන සාර්ථක මෙවලමකි. බැංකුවකින් ණය ලබාගැනීමට සුදුසුකම් නැති සමාජ තීරුව නියෝජනය කරන අයට මේ ක්‍රමය ඔස්සේ ස්වයං ජීවන මාර්ග සලසාගැනීම අවශ්‍ය ප්‍රාග්ධනය ඉතාම සහන පදනමක් මත සැපයේ. බංග්ලාදේශය මේ පිළිබඳ හොඳ ආදර්ශයකි. මේ විෂය පිළිබඳ බොහෝ අධ්‍යයනයන් සිදු කර ඇති අතර එය සාධනීය ක්‍රමවේදයක් ලෙස පිළිගැනීමට ලක්ව තිබේ.

ක්ෂුද්‍රමූල්‍ය ණය ක්‍රමයේ ආරම්භක ප්‍රාග්ධනය ගොඩනැගෙන්නේ ඊට සම්බන්ධ වන සාමාජිකයින්ගේ ඉතුරුම්වලිනි. ඔවුන් සකසුරුවමට හා ඉතිරි කිරීමට හුරු වෙමින් අරමුදලක් ගොඩනගාගෙන, ඉතා සුළු පරිමාණයෙන් ණය දීම අරඹන අතර මේ සඳහා අය කරන්නේ ඉතා සුළු පොලියකි. ඒ ආකාරයෙන් සාර්ථකව පවත්වාගෙන යන සමිති පසුව වෙනත් ආයතනවල ණය වැඩසටහන් සමග සම්බන්ධ වන අතර ඒ ණය ලබා දෙන්නේ යෝජිත ව්‍යාපෘති හා ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳ  නිසි තක්සේරුවකින් අනතුරුවය. රජයේ මූල්‍ය බලධාරීන් මෙම කාර්යය නියාමනය කරයි.

එහෙත් ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය ණය ක්‍රමය ආරම්භයේ පටන්ම එහි මූලික පරමාර්ථවලින් බැහැර වූ විකෘති ස්වරූපයකින් ක්‍රියාත්මක වෙයි. හතු පිපෙන්නාක් මෙන් බිහි වන මූල්‍ය ආයතන ගම්වලට පැමිණ, නිසි තක්සේරුවකින් තොරව තරගයට මෙන් ග්‍රාමීය කාන්තාවන්ට ණය ලබා දෙන අතර, ඒ සඳහා අධික පොලියක් අය කරයි. ණය ලබා දීමේදී එම ණය කුමන කාර්යයකට යොදාගන්නේද යන්න සලකා නොබැලෙන අතර ණය ආපසු ගෙවීමේ හැකියාව ගැනද නිසි තක්සේරුවක් නැත. මේ ආකාරයට ණය ලබාගත් කාන්තාවන් ලක්ෂ ගණනක්, ඒවා ආපසු ගෙවාගත නොහැකිව බරපතළ ණය උගුලක සිර වී සිටීම බරපතළ සමාජ අර්බුදයක්

බවට පත්ව ඇත. පවුල් ආරවුල්, මානසික ගැටලු මෙන්ම සියදිවි නසාගැනීම්වලට පවා මෙම තත්ත්වය හේතු වී තිබේ.

තමන් ණය ලබාගත් කොන්දේසි මොනවාද යන්න පිළිබඳව ණයලාභීන් බොහෝ දෙනෙකුට අවබෝධයක් නොමැති අතර ඔවුන් ලවා අත්සන් ගත් ණය ගිවිසුම් ඇත්තේ ඉංග්‍රිසි භාෂාවෙනි. ඒ අනුව සිංහල හා දෙමළ ජනයාගේ භාෂා අයිතියද එමගින් උල්ලංඝනය වී තිබේ. අදාළ ගිවිසුම්වල පිටපත් ණයලාභියාට ලබා නොදීම, ණය වාරික ගෙවීමේදී රිසිට්පත් ලබා නොදීම ආදී හේතු නිසා තමන් ගත් ණය මුදලින් ආපසු ගෙවා ඇති ප්‍රමාණය පිළිබඳව ණයලාභීන්ට ඇත්තේ ව්‍යාකූල අදහසකි. මෙම තත්ත්වය මත ණයලාභීන් දැඩි සූරාකෑමකට ලක් වන බව නොරහසකි. ණය ලබාදෙන මූල්‍ය ආයතනවලට එල්ල වන චෝදනා පිළිබඳව ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට අප වෑයම් කළද ඔවුන්ගෙන් පළ වූයේ මගහරිනසුලු ප්‍රතිචාරයකි.

ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය ණය සම්බන්ධ ප්‍රමුඛම ගැටලුව වන්නේ, මූල්‍ය ආයතන නියාමනය සම්බන්ධ නිල වගකීම උසුලන ශ්‍රී ලංකා මහ බැංකුවේ කිසිදු නියාමනයක් මෙම ක්ෂුද්‍රමූල්‍ය ආයතන බොහොමයක් සම්බන්ධයෙන් නොමැති වීමයි. බලපත්‍රලාභී බැංකු සහ මූල්‍ය සමාගම් හැරුණු විට, මහබැංකුව යටතේ ලියාපදිංචි ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ඇත්තේ 4ක් පමණි. එහෙත් මහබැංකුවේම වාර්තාවලට අනුව විවිධ ආයතන සිය ගණනක් ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රයේ නිරත වෙයි.

**ණය ලබා දීමේදී එම ණය කුමන කාර්යයකට යොදාගන්නේද යන්න සලකා නොබැලෙන අතර ණය ආපසු ගෙවීමේ හැකියාව ගැනද නිසි තක්සේරුවක් නැත. මේ ආකාරයට ණය ලබාගත් කාන්තාවන් ලක්ෂ ගණනක්, ඒවා ආපසු ගෙවාගත නොහැකිව බරපතළ ණය උගුලක සිරවී සිටීම බරපතළ සමාජ අර්බුදයක් බවට පත්ව ඇත.**

පවතින අර්බුදය කෙතරම් සංකීර්ණ එකක්ද යන්න ඒ අනුව වටහාගත හැකිය.

ක්ෂුද්‍රමූල්‍ය ණය හේතුවෙන් මතු වී ඇති ගැටලු සම්බන්ධයෙන් දිවයිනේ විවිධ ප්‍රදේශ ආශ්‍රිතව අප කළ සොයාබැලීමේදී හෙළි වූ තොරතුරු මෙම කලාපයෙන් හෙළි කෙරේ. විශේෂයෙන්ම එම අර්බුදයට මුහුණ පා සිටින වින්දිතයන්ගේ හඬට මෙහිදී වැඩි අවධානයක් යොමු කර ඇත. අර්බුදයේ විවිධ පැතිකඩ පිළිබඳව එමගින් පිළිබිඹු වේ.

මේ තත්ත්වය සම්බන්ධයෙන් රජය වහා මැදිහත් විය යුතු අතර, ක්ෂුද්‍රමූල්‍ය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කොට එම ක්ෂේත්‍රය විධිමත් නියාමනයකට ලක් කළ යුතුය. පාර්ලිමේන්තුවේ මුදල් පිළිබඳ කාරක සභාව, මුදල් අමාත්‍යාංශය හා මහබැංකුව එක්ව මේ සම්බන්ධයෙන් පුළුල් ලෙස කරුණු සොයාබැලීමට යොමු විය යුතුය. අත්තනෝමතික හා අසාධාරණ ලෙස කටයුතු කර ඇති ආයතන සම්බන්ධයෙන් දැඩි පියවර ගත යුතු අතර අසාධාරණයට ලක්ව සිටින ණයලාභීන්ට උපරිම සහන සලසන වැඩපිළිවෙළක් වහාම ආරම්භ විය යුතු බව අපේ නිරීක්ෂණයයි.

මෙම අර්බුදය පිළිබඳව ක්ෂුද්‍රමූල්‍ය විශේෂඥයින්, සිවිල් සමාජය, ප්‍රතිපත්ති සම්පාදකයින් ඇතුළු සියලු පාර්ශ්ව පුළුල් සංවාදයකට යොමු වීම කාලීන අවශ්‍යතාවකි.

**සංස්කාරක**

# ක්ෂුද්‍රමූල්‍යකරණය
# ශ්‍රී ලංකාවේ සාර්ව සමාජ ව්‍යසනයකට තුඩු දිය හැකි ආකාරය

**තුසිත සිරිවර්ධන** - නීතිඥ/පර්යේෂක - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

අඩු ආදායම්ලාභීන්ට අත්‍යවශ්‍ය මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය බොහෝ විට නොමැති අවස්ථාවන්හීදී ක්ෂුද්‍රමූල්‍යකරණය ආර්ථිකයේ අත්‍යවශ්‍ය අංගයක් වේ. අඩු ආදායම්ලාභී ජනතාව අතර මූල්‍ය සේවා සඳහා වැඩිදියුණු කළ ප්‍රවේශයන් දරිද්‍රතාව අඩු කිරීමට හේතු වෙයි. අඩු වරප්‍රසාද ලත් අයට වත්කම් ගොඩනඟා ගැනීමට හා ඔවුන්ගේ ආදායම වැඩි කිරීමට සහාය වන අතර, ආර්ථික අවපාතවලට ගොදුරු වීමේ අවදානම අඩු කරයි. තවද, දුප්පතුන්ට සහය වීම සඳහා උපදේශක කණ්ඩායම (CGAP, 2006) ක්ෂුද්‍රමූල්‍යකරණය යනු "අඩු ආදායම්ලාභීන්ට මූල්‍ය සේවා සැපයීම" ලෙස අර්ථ දක්වා ඇති අතර, "ක්ෂුද්‍ර මූල්‍ය සේවා මගින් මිනිසුන්ට ඔවුන්ගේම පසුතලය මත දිළිඳුකමට එරෙහිව තිරසාර ලෙස



## පොලිය වැඩි කර කර ලියුම් එවනවා

**ක්‍රිස්තිනා හාමිනේ**
කන්තලේ

ආණ්ඩුව ණය කපනව කියපු නිසා අපි ගෙව්වෙ නෑ. දැන් පොලිය එකට තුන හතර කරලා ගෙවන්න කියලා ලියුම් එවනවා. අපි කොහොමද එහෙම ගෙවන්නේ? ඒ කාලෙ නම් කිව්වෙ පොලිය සීයට 18යි කියලා. දැන් සීයට 31ක් වෙලා. අද ලියුමක් ආවොත් තිස්හතරදාහක් ගෙවන්න කියලා, තව සුමානෙකින් කියනවා පනස්හතරදාහක් ගෙවන්නලු.

අපි මේ දුක්ගැනවිල්ල කියන්න මහ බැංකුවට ගියා. ඒ මහත්තුරු එක්ක පැයක් විතර කතා කළා. අපිට කිව්වා මොනවහරි විසඳුමක් දෙන්නම් කියලා. අපි බලාගෙන ඉන්නවා සාධාරණයක් කරනකල්.

සටන් කිරීමට උපකාර වන බව” වැඩිදුරටත් සඳහන් කරයි.

විශේෂයෙන්ම මූල්‍ය ප්‍රවේශය ඉතා අඩු වන ශ්‍රී ලංකාවේ ඇති සන්දර්භය තුළ ක්ෂුද්‍රමූල්‍යකරණය අත්‍යවශ්‍ය බවට තර්කය හොඳින් පිළිගැනේ. අනවසර මූල්‍ය ව්‍යාපාර මගින් පාරිභෝගිකයන් සූරාකෑමට ලක්වීම වැළැක්වීම සඳහා ශක්තිමත් නියාමන සහ අධීක්ෂණ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

මෙම සන්දර්භය තුළ, විවිධ මූල්‍ය ආයතන විසින් සපයනු ලබන ක්ෂුද්‍ර ණය පහසුකම් සම්බන්ධයෙන් ගත් කල, අවම හෝ වත්කම් නොමැති දුප්පත් සහ ආන්තික ප්‍රජාවන් මූලිකව ඉලක්කගත කරගෙන මූල්‍ය අරමුදල් ප්‍රවේශය සපයනු ලබයි. තවද, බොහෝ ප්‍රාදේශීය ප්‍රදේශවල, මූල්‍ය ආයතන රැසකින් ණය පහසුකම් ලබා ඇති සහ අනෙක් අතට, තම අයිතිවාසිකම් කඩවීම්වලට මුහුණ දීමට ලක් විය හැකි අති බහුතරය කාන්තාවන් සහ කාන්තා කණ්ඩායම්වල සාමාජිකයන් බව ද සත්‍යයකි.

මෙම ලිපියෙන් පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල ප්‍රජාවන් මුහුණ දෙන තීරණාත්මක ගැටලු කෙටියෙන් ඉස්මතු කරයි. කෙසේ වෙතත්, ගැටලුවල හරය ලෙස මතු වූයේ නියාමන හා අධීක්ෂණ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක නොවීම, ණය ලබන්නන්ගේ දැනුම හා අවබෝධය නොමැතිකම, නීතිමය රාමු සහ යොමු කිරීමේ ක්‍රමය සම්බන්ධයෙන් දැනුමක් නොමැතිකම යන කරුණු බව කවුරුත් දනිති. අනවසර මූල්‍ය ව්‍යාපාරවලට ගොදුරු වූවන්ට පිළියම් සෙවිය හැකි ක්‍රමවේද රටේ අනෙකුත් ප්‍රදේශවල ඇති ක්‍රමවේද ද අඩු වැඩි වශයෙන් සමාන වේ.

ක්ෂුද්‍රමූල්‍ය හෝ ක්ෂුද්‍ර ණය සේවාවන්ට



## පොලියට සල්ලි අරගෙන ලෝන් ගෙවනවා

**කේ. එම්. චිත්‍රා කුමාරි**
තල්ගස්වැව

අපි දැන් පොලියටත් පොලී ගෙවල තියෙන්නෙ. ලෝන් එක ලක්ෂයයි නම් ලක්ෂ එකහමාරක් දෙකක් ගෙවල තියෙන්නෙ. තවත් ගෙවන්න කියල ලියුම් එවනවා. අපි කොහොමද එහෙම ගෙවන්නෙ? මේ තල්ගස්වැව ගම්මානෙ හැමෝම ඒ අමාරුවෙ වැටිල ඉන්නෙ. ණය ගෙවාගන්න බැරිව, කඩවල්වලට ගෙවාගන්න බැරිව, තව පොලියට සල්ලි අරන් අන්ත අසරණ වෙලා ඉන්නෙ. මමත් ලක්ෂයක් විතර පොලියට අරගෙන තියනව ඒ ණය වාරික ගෙවන්න. රත්තරන් බඩු මොනවත් නෑ දැන්, ලෝන්වලටම ගෙවලා.

ණය ගිවිසුම් ඔක්කොම තියෙන්නෙ ඉංග්‍රිසියෙන්. මොනව තිබුණද කියල අපි දන්නෙ නෑ. කියන කියන තැන්වල විසිපස් පොළක විතර අත්සන් කළා. දැන් කියනවා, අපේ ඉඩම්, දේපළ ඔක්කොම අයිති කර ගන්නව කියලලු ඒ අත්සන් අරන් තියෙන්නෙ.

ළමයි ලෙඩ වෙලා ඒවට වියදම වුණාම එහෙම අපට ණය වාරික ගෙවාගන්න බැරි වෙනවා. ඒ වගේ වෙලාවට සල්ලි නෑ කිව්වත් ණය එකතු කරන අය යන්නෙ නෑ, පැය ගණන් ඉඳගෙන ඉන්නවා. දරුවට කිරි දිදී ඉන්නකොටත් ඇවිත් බණිනවා. ළමයි ඉස්සරහත් බණිනවා. පාරෙදි හම්බවුණත් බයික් එක නතර කරලා බණිනවා.

සම්බන්ධ ප්‍රජාවන් මුහුණ දෙන ගැටලු රාශියක් හේතුවෙන්, සැලකිය යුතු කාන්තාවන් පිරිසක් ඔවුන්ගේ යහපැවැත්ම පිළිබඳ අවම මට්ටමක් හෝ පවත්වා ගැනීමට දැඩි වෙහෙසක් දරති. බොහෝ අවස්ථාවල විවිධ මානව හිමිකම් උල්ලංඝනය වීමේ අවදානමකටද ලක්ව ඇත. ක්ෂුද්‍රමූල්‍ය හෝ ක්ෂුද්‍ර ණය සේවා වෙත පහසුවෙන් ප්‍රවේශ වීමෙන් තම ජීවනෝපාය නැවත ගොඩනගා ගැනීමට අපේක්ෂා කළ පුද්ගලයින්ට තම වත්කම් අහිමි වීමට අමතරව ඔවුන්ගේ මානව ගරුත්වය ද අහිමි වී ඇති බව පෙනේ. මිනිසුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සමාජ සංවාදවල සහ ජීවිතයේ සෑම අංශයකම අර්ථවත් වගවීමක් ඉල්ලා සිටින ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සාකච්ඡාවල සන්දර්භය තුළ ජීවනෝපාය සඳහා ඇති අයිතිය "ජීවත්වීමේ අයිතියෙහි" අනිවාර්ය අංගයක් ලෙස පිළිගත හැකි ආකාරය විමසා බැලීම වැදගත් වේ. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මූලික මානව හිමිකම් ලෙස පැහැදිලිව පිළිගෙන නොතිබුණද, අඩු ආදායම් සහ වත්කම් අඩු ප්‍රජාවන්ට මනාව නියාමනය කරන ලද මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය සහතික කරන අතරම මූලික මානව හිමිකම් ආරක්ෂා කළ හැක.

අනෙකුත් අධිකරණ බල ප්‍රදේශවල ජීවත්වීමේ අයිතිය සම්බන්ධයෙන් අධිකරණ අර්ථකථන නිරීක්ෂණය කරන විට මිනිසුන්ගේ මානව හිමිකම් පිළිබඳ පුළුල් හා අර්ථවත් අර්ථකථන සැපයීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය, "පදික වාසීන්ගේ නඩුව" (ඔල්ගා ටෙලිස් එදිරිව බොම්බේ මහ නගර සභාව) තුළින් ප්‍රකාශ කර සිටින්නේ ජීවනෝපායට ඇති අයිතිය ජීවත්වීමේ අයිතිය තුළින් පැන නගින අතර, කිසිවකුට ජීවත්වීමේ මාධ්‍යයන් නොමැතිව ජීවත් විය නොහැකි බැවින්, එය ජීවනෝපායේ මාර්ගය ලෙස සැලකිය යුතු බවයි. එබැවින්, දරිද්‍රතාවට එරෙහිව සටන් කිරීම සඳහා අඩු ආදායම්ලාභී කණ්ඩායම්වලට සහාය වීමට ක්‍රියාත්මක වන අනවසර මූල්‍ය ව්‍යාපාරික සේවා සහ ක්‍රියාකාරකම් හේතුවෙන් ප්‍රජාවන් මුහුණ දෙන ප්‍රශ්න සහ අභියෝග දෙස බැලීම ප්‍රධාන



## මහත්තය මියගියත්, කියපු විදියට ණය කැපුවෙ නෑ

**සුමුදු ප්‍රියංකා හෙට්ටිආරච්චි**
අලුත්ඔය

මම ගත්ත ණය ගෙවාගෙන යද්දි, මහත්තයට හාට් ඇටෑක් එකක් හැදිල ගෙවාගන්න බැරි වුණා. ඊට අවුරුද්දකට විතර පස්සෙ මහත්තය නැති වුණා. අපිට ණය දෙනකොට කියල තිබුණෙ, ඇපේට අත්සන් කරපු පුතා හරි, මහත්තය හරි නැති වුණොත් ණය කපාහරිනව කියලා. ඒත් එහෙම කළේ නෑ. මහත්තයා නැති වුණාට පස්සෙ මට නඩු දැම්මා. මම ඉඩමක් විකුණලා තමයි ඒ ණය ඉවර කළේ. තව කොමර්ෂල් ක්‍රෙඩිට් එකෙන් ගත්ත ණයකින් ගෙවන්න ඉතිරි වෙලා තියනවා 62,000ක්. දැන් ඒකට නඩු දානව කියලා ලියුම් එවල තියෙන්නෙ. ඇත්තටම මම අසරණ වෙලා ඉන්නෙ මේ වෙලාවෙ. පුතා ගාමන්ට් එකේ රස්සාව කරලා මට කන්න දෙන්නෙ. මම කියන්නෙ කිසිම කෙනෙක්, මේ වගේ බොරු කරලා ණය දෙන ආයතනවලින් ණය ගන්න එපා.

අංගයක් බවට පත් වේ. මේ අතර, මෙය මූලික වශයෙන් දිළිඳු ජනතාව තවදුරටත් මර්දනය කිරීමට හේතු වී තිබේ.

මෙම ලිපියේ තොරතුරු ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ ජාතික සහයෝගීතා සහ සංවර්ධන පදනම සහ ස්වාධීන රාජ්‍ය ආයතන ගණනාවක් කොමිෂන් සභා සහ අනෙකුත් රාජ්‍ය නොවන පාර්ශවකරුවන් සමඟ සමීප සහයෝගීතාවයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කරන ලද සාක්ෂි පදනම් කරගත් තොරතුරු රැස් කිරීම සහ උද්දේශන මුලපිරීම් මත ය.

## ක්ෂුද්‍රමූල්‍ය සහ ක්ෂුද්‍ර ණය සම්බන්ධ ක්‍රියාකාරකම් පාලනය කරන නීති මොනවාද?

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත, ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර ලබාදීම, නියාමනය සහ අධීක්ෂණය සඳහා ප්‍රතිපාදන සපයන ප්‍රධාන නීතිය වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් වෙත සමාගමේ ව්‍යාපාර සහ ආයතනික කටයුතු පිළිබඳ ඕනෑම අංශයක් සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කළ හැක. පනතේ 12 වැනි වගන්තියේ (1) සහ (2) උප වගන්ති යටතේ, මණ්ඩලයට අනුකූලතාව



### අවුරුද්දක්ම ගෙවපු සල්ලි පොතට වැටිල නෑ

**ජී. ජී. නිලූකා කුමාරි**
තල්ගස්වැව

මම ණය ගත්තෙ එච්.එන්.බි ග්‍රාමීන් එකෙන්. රු 13,000 ගානෙ අවුරුද්දක් තිස්සෙ ගෙව්වා. මේ වෙනකල් අපිට කිසිම ලේඛනයක් දීල නෑ. අපි සල්ලි දැම්මෙ කාඩ් එකට. බස් ටිකට් එකක් වගේ මැෂිමෙන් එන රිසිට් එකක් විතරයි ලැබුණෙ. ඒවා ටික දවසකින් දියවෙලා මැකිල යනවා. දැන් අපි සතයක් වත් නොගෙව්ව වගේ ලක්ෂ දෙකයි ගාණක් ගෙවන්න කියල නඩු දාල තියෙන්නෙ. ඉන්ෂුවරන්ස් එකට කියලා රු. 15,000ක් කපාගත්තා. ඒකටවත් කිසිම රිසිට් එකක් දීල නෑ. අපි ණය ගත්තෙ නෑ කියන්නෙ නෑ. ගත්තා තමයි. පුළුවන් විදියට ගෙවාගෙන ගියා. ඒ අතරෙ ආණ්ඩුවෙන් කිව්වා 2018 අගෝස්තු 18 වැනිදා ඉඳලා සියලුම කාන්තාවන් ක්ෂුද්‍ර මූල්‍ය ණයවලින් නිදහස් කරනවා කියලා. පත්තරවලින්, නිව්ස්වලින් මේ ගැන දැනගන්න ලැබුණා. ඉන් පස්සෙ අපි සමිතිවලට කතා කරලා කිව්වා, රජයෙන් මෙහෙම ණය කපනවා කියනවා. ඒ නිසා අපි ගෙවන්නෙ නෑ කියලා. අපි බාගෙට බාගයක් ගෙවලා තිබුණෙ. ගොඩක් දෙනාට විසිදාහ තිස්දාහ වගේ ගෙවන්න ඉතිරිවෙලා තිබුණෙ. ඒ වගේ 50-60ක් විතර ඉන්නව අපේ ගමේ.

ඊත් ආණ්ඩුව කියපු හැටියට ණය කැපුවෙ නෑ. දැන් අපිට ගත්තු ගාණටත් වැඩිය රු. ලක්ෂෙ, ලක්ෂ එකහමාර වගේ ගණන් ගෙවන්න කියල ලියුම් එවනවා. ගෙවල්වලට ඇවිත් බණිනවා. ඊයෙ මම ගෙදර හිටියෙ නෑ, ඇවිත් අම්මට බැණල ගිහින්. ඇත්තටම අපි ලොකු අසාධාරණයකට ලක් වෙලා ඉන්නේ.

නිරීක්ෂණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කළ හැක. ඒවා පිළිපැදීමට අපොහොසත් වුවහොත්, එය පිළිවෙළින් 17 වගන්තියේ විධිවිධාන යටතේ එම ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ බලපත්‍රය අවලංගු කළ හැක.

2019 දී, මුදල් ණය දෙන ව්‍යාපාරය සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය නියාමනය කිරීම සඳහා නීති සම්පාදනයක් හඳුන්වා දීමටත්, එම ව්‍යාපාරවල ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව ඇතුළුව ඊට අමතරව ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහාද නීති සම්පාදනය කිරීමටත් උත්සාහයක් ගන්නා ලදි. කෙසේ වෙතත්, වසර කිහිපයක් ගත වී ඇතත්, එම පනත් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුවේ එකතැන පල්වෙමින් පවතින අතර, එය තවමත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැත. සැලකිය යුතු කරුණ නම්, මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර, කෝවිඩ් - 19 වසංගතය සහ පසුව ඇති වූ ආර්ථික අර්බුද සන්දර්භය මධ්‍යයයේ මුදල් පොලී ව්‍යාපාරය සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය සම්බන්ධයෙන් මෑතකාලීන වර්ධනයන් යාවත්කාලීන කිරීම සඳහා පුළුල් සමාලෝචනයක් අවශ්‍ය වීමයි.

## ක්ෂුද්‍රමූල්‍ය ආශ්‍රිත සේවාවන් හෝ ණය පහසුකම් සපයන්නේ කවුද?

මහ බැංකුවේ ඇති විස්තරවලට අනුව, 2021 ජුනි 30 වන විට බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් හතරක් පමණක් ඇත. ඒවා නම්,

1) සීමාසහිත බෙරෙන්ඩිනා මයික්‍රෝ ආයෝජන සමාගම
2) ලක් ජය මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්
3) දුම්බර මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
4) සීජය මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටෙඩ්

මෙහිදී සැලකිය යුතු කරුණක් නම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ලෙස ලියාපදිංචි වී නොමැති නමුත් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් ලෙස ලියාපදිංචි වී ඇති වෙනත් ආයතන කිහිපයක් විවිධ අරමුණු සඳහා කුඩා පරිමාණ ණය පහසුකම් ලබා දීමයි. එවැනි බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ නියාමනය කර අධීක්ෂණය කරනු ලැබේ. මීට පෙර ක්‍රියාත්මක වූ 1998 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත වෙනුවට මූල්‍ය ව්‍යාපාර පනත හඳුන්වාදීමේ මූලික අරමුණක් වූයේ නියාමනය නොකළ, නීති



### රත්තරන් බඩු ඔක්කොම බැංකුවට සින්න වුණා

**එම්.ඒ. නිශාන්ති නිල්මිණි**
සිංහගම, අග්බෝපුර

මම කොමර්ෂල් ක්‍රෙඩිට් එකෙන් ණයක් අරගෙන තිබුණා. ඉන් පස්සෙ හදිසි උවමනාවක් වෙලා, පවුම් තුනහමාරක මාලෙකුයි, පවුමක පෙත්තකුයි, මුදු හතරකුයි තියලා ණයක් ගත්තා. පස්සෙ, මම ඒව බේරගන්න ගියාම “ණය ඇරියස් වෙලා තියනවා, ඒව ගෙවනකල් මේව බේරගන්න අමාරුයි” කියල කිව්වා. ඒ අවස්ථාවෙ බේරගන්න බැරිවුණා. ආය ඒ ගැන මොනවත් කරන්න වුණේ නැහැ. ඒ බඩු සේරම බැංකුවට සින්න වුණා.

විරෝධී සහ අනවසර මූල්‍ය ව්‍යාපාර නියාමනය සහ අධීක්ෂණය. ශක්තිමත් කිරීමයි. එයින් පෙන්නුම් කරන්නේ මීට දශකයකට පෙර පවා අනවසර මූල්‍ය ව්‍යාපාරවල මූල්‍ය සේවාවන් ලබා ගත් ජනතාවට අහිතකර ලෙස බලපාන ගැටලු නිර්මාණය කර ඇති බවයි.

කෙසේ වෙතත්, ක්ෂුද්‍රමූල්‍ය ආශ්‍රිත, ක්ෂුද්‍ර ණය සහ/හෝ මුදල් ණය දීමේ සේවා සපයන බොහෝ ආයතන ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයන්ගේ සංගමයේ කෘණ්ඩ දෙකක් යටතේ සාමාජිකත්වය ලබාගෙන ඇත 1). සාමාන්‍ය සාමාජිකයන් සහ 2). අනුබද්ධ සාමාජිකයන් ලෙසයි. ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයින්ගේ සංගමය යනු ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයන් කිහිප දෙනෙකු විසින් පිහිටුවා ගත් ජාලයකි. ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයින්ගේ සංගමය ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය ආයතන සඳහා සම්බන්ධීකරණ ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගෙන ඇත.

වඩාත්ම වැදගත් දෙය නම්, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ක්ෂුද්‍ර ණය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලී සිටින වෙනත් ඕනෑම ආයතනයක් හෝ පුද්ගලයෙකු විසින් සපයනු ලබන සියලුම ආකාරයේ ණය සේවා ඇතුළුව ක්ෂුද්‍රමූල්‍ය හා සම්බන්ධ සියලු අංශ පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් නොමැතිකම ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රතිපත්තිමය ගැටලුවක් ලෙස හඳුනා ගෙන ඇත. එවැනි ජාතික ප්‍රතිපත්තියක් නොතිබීම හේතුවෙන් මතු වන ප්‍රතිවිපාක තවදුරටත් උග්‍ර වන්නේ මුදල් ණය දීමේ නිර්ණායක, පොලී ගණනය කිරීමේ ක්‍රමය සහ ණය පැහැර හැරීමේ නීතිමය ප්‍රතිවිපාක සහ ප්‍රමාදයන් සඳහා අමතර ගාස්තු පිළිබඳව සේවා ලබන්නන් ලෙස ප්‍රජාවන් තුළ ඇති සීමිත අවබෝධයයි. එසේම, ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා දෙන ආයතනවල ක්‍රියාකාරිත්වය සහ නීත්‍යානුකූලභාවය පිළිබඳ තොරතුරු නොමැතිකම සහ අසාධාරණයක් සිදු වූ විට ඒවාට පිළියම් සෙවිය හැකි යොමු කිරීමේ පද්ධති පිළිබඳ දැනුම නොමැතිකමයි.

## ක්ෂුද්‍රමූල්‍ය හෝ ක්ෂුද්‍ර ණය සේවා මුවාවෙන් සිදුවන නියාමනය නොකළ සහ නීති විරෝධී ක්‍රියාකාරකම්වල සමාජ බලපෑම.

ක්ෂුද්‍රමූල්‍ය හෝ ක්ෂුද්‍ර ණය ආශ්‍රිත සේවාවන් ලබා ඇති බොහෝ පුද්ගලයන්, විශේෂයෙන්ම කෝවිඩ්-19 වසංගතය සහ පසුව ඇති වූ ආර්ථික අර්බුද සන්දර්භය මධ්‍යයේ අසාධාරණයන් ඇතුළු විවිධ ගැටලුවලට ලක්ව ඇත.

### නියාමනය නොකළ මුදල් ණය දීමේ/ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර ක්‍රියාකාරකම් හේතුවෙන් ගනුදෙනුකරුවන් මුහුණ දෙන ගැටලු

- ණය ගිවිසුම් ණය ලාභීන්ට නොවැටහෙන භාෂාවකින් (බොහෝ විට ඉංග්‍රීසි) තිබීම හේතුවෙන් ඔවුන්ගේ භාෂා හිමිකම උල්ලංඝනය වීම.
- ණය ලබන්නන්ට ණය ගිවිසුම්වල පිටපත් ලබා නොදීම
- අයුක්ති සහගත පොලී අනුපාත අය කිරීම
- මුදල් එකතු කරන්නන් ණය ලබන්නන්ට වාචිකව හිරිහැර කිරීම/බිය ගැන්වීම
- නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට ණය ලබන්නන්ට තර්ජනය කිරීම
- ණය සම්බන්ධ කාරණාවල නීතිමය හෝ යොමු කිරීමේ පද්ධති පිළිබඳ තොරතුරු සඳහා ප්‍රවේශය නොමැතිකම
- ගෙවීම් සඳහා දිගු කල් පවතින රිසිට්පත් ලබා නොදීම

- දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් බලධාරීන්ගේ පසු විපරම්/අධීක්ෂණය නොමැතිකම
- ගෞරවනීය ජීවිතයක් සඳහා ඇති අයිතියට අහිතකර ප්‍රතිවිපාක
- ලිංගික හිරිහැර/ණය වාරික ගෙවීමට නොහැකි වූ විට ලිංගික අල්ලස් ඉල්ලා සිටීම
- කාන්තාවන්ගේ රහස්‍යතා අයිතීන් උල්ලංඝනය කිරීම
- මූල්‍ය කළමනාකරණය සහ පවතින සහන යාන්ත්‍රණයන් පිළිබඳව ණය ලබන්නන්ගේ දැනුම නොමැතිකම
- පෙර ගනුදෙනු හා සම්බන්ධ කරුණු පැහැර හැරීම සඳහා
- අසාධාරණ ණය නැවත සැලසුම් කිරීම සහ පැමිණිලි යාන්ත්‍රණයක් නොමැතිකම
- ලැබුණු මූල්‍ය සේවාවන් ඵලදායී ලෙස භාවිත කිරීම පිළිබඳ පසු විපරම්/අධීක්ෂණයක් නොමැති වීම.
- ණයලාභීන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයට අහිතකර බලපෑම්
- ණය ලබන්නන්ගේ මානසික කම්පනය සමස්ත සමාජ යහපැවැත්ම පිරිහීමට තුඩු දීම

ක්ෂුද්‍රමූල්‍ය හෝ ක්ෂුද්‍ර ණය සේවා හරහා ලබා ගත් මූල්‍ය සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා ප්‍රජාවන්ගේ දැනුම හා අවබෝධය නොමැතිකම යන කාරණයද මෙම ගැටලු උග්‍ර කිරීමට සහාය වී ඇති අතර, නියාමන පද්ධතිවල හිදැස් සහ දුර්වලතා මූලික අභියෝගය ලෙස හඳුනාගත හැක. ක්ෂුද්‍රමූල්‍ය අංශයේ සහ සමාජයේ අඩු ආදායම්ලාභී කොටස් ඉලක්ක කරන අනෙකුත් මූල්‍ය සේවා අංශයේ ප්‍රායෝගික හා ප්‍රතිපත්ති මට්ටමේ ප්‍රතිසංස්කරණ, මෙම නියාමන අභියෝගයට මුහුණ සඳහා අවශ්‍ය වේ. පාරම්පරිකව අඩු දේපළ හිමිකාරිත්වයක් ඇති කාන්තාවන් එවැනි මූල්‍ය ආධාර ලබා ගන්නා පුද්ගලයන්




## ණය ගෙවලා ඉවර වුණත් ඔප්පුව දුන්නෙ නෑ

**එම්.ජී. සිරෝමි**
කන්තලේ

පළමුවරට ඔප්පුවක් තියලා එල්.ඕ.සී. එකෙන් ලක්ෂ තුනක් ගත්තා. ඒක ගෙවාගෙන යන අතරෙ, තුන්දෙනෙකුගෙ කණ්ඩායමක් හැදිලා තව ලක්ෂයක් ගත්තා. ඉන් පස්සෙ ඔප්පුව තියල ගත්ත ණය ගෙවල ඉවර වුණා. ඒත් ඔප්පුව ඉල්ලුවට දුන්නෙ නෑ, කණ්ඩායම් ණය තව ගෙවන්න තියනව කියලා. ඉන් පස්සෙ ඒකත් ගෙවල ගිහින් ඔප්පුව ඉල්ලුවාම, මම ඇපේට අස්සන් කරපු කණ්ඩායම් ණයේ අනිත් දෙන්නගෙ හිඟ තියනව කියල ඔප්පුව දෙන්න බැහැ කියනවා. මම 2021 පළවෙනි මාසෙ තමයි ඔප්පුව තියලා ගත්ත ණය ගෙවල ඉවර කළේ. දැන් අවුරුද්දකට වැඩියි ඔප්පුව ආපහු දෙන්නෙ නෑ. මගෙ මහත්තය පොලියට සල්ලි අරගෙන දීල තමයි ඒ ණය ගෙව්වෙ. ඒත් අපේ ඔප්පුව දෙන්නෙ නෑ.

අතර බහුතරය වේ. මේ අනුව, මෙම ප්‍රශ්නවල ප්‍රතිවිපාක තනි තනි කාන්තාවන්ට පමණක් නොව ඔවුන්ගේ පුළුල් පවුල් පද්ධතිය මතටද පහසුවෙන් දිව යන අතරම එම ආරම්භක ආර්ථික ගැටලුව ඉතා සංකීර්ණ ආපසු හැරවිය නොහැකි සමාජ ව්‍යසනයක් බවට පරිවර්තනය කර ක්ෂුද්‍රමූල්‍ය/ක්ෂුද්‍ර ණය සේවාවල මූලික අරමුණු ව්‍යර්ථ කර දමයි

ක්ෂුද්‍ර මූල්‍ය/ක්ෂුද්‍ර ණය සේවාවල කොටසක් ලෙස සිදු වන නියාමනය නොකළ, අනවසර හා නීති විරෝධී ක්‍රියාකාරකම්වල බරපතළකම, කාන්තා ණය ලබන්නන් විසින් බෙදා ගන්නා ලද සමහර පෞද්ගලික අත්දැකීම් දෙස බැලීමෙන් කෙනෙකුට තේරුම් ගත හැක.

කන්තලේ ප්‍රදේශයේ ණය ලාභිනියක් ප්‍රකාශ කළේ, "මගේ සැමියා නීත්‍යානුකූල හිමිකරු වන අපේ ඉඩම් ඔප්පුවට එරෙහිව අපි මූල්‍ය ආයතනයකින් රුපියල් ලක්ෂ 3ක ණයක් ලබාගෙන තිබුණා. එම ණය මුදල අප දෙදෙනාගේම නමින් තිබුණේ ණය මුදල ඉල්ලුම් කිරීම සඳහා අදාළ මූල්‍ය ආයතනයට අවශ්‍ය වූයේ මගේ සැමියාට ණය ලබා ගැනීම සඳහා මූල්‍ය ආයතනයේ හවුල් ගිණුමක් ආරම්භ කිරීමටයි. අපි එම ණය මුදල නිසි ලෙස ගෙවන අතර තුර මම මූල්‍ය ආයතනයෙන් වෙනම ණයක් ගත් අතර එය මගේ ප්‍රජාවේ අනෙක් කාන්තාවන් දෙදෙනෙකු සමඟ ගත් සමූහ ණයක්. අප ගත් ණය සහ ඔප්පුව අතර කිසිසේත්ම සම්බන්ධයක් නැත, කෙසේ වෙතත්, ණය ආපසු ගෙවීම අවසන් වූ පසු, අපි ඔප්පුව අපට ආපසු දෙන ලෙස මූල්‍ය ආයතනයෙන් ඉල්ලා සිටියා, පුදුමයට මෙන් ඔවුන් පසුව ලබා ගත් සමූහ ණය මුදලේ සම්පූර්ණ මුදලද මා ආපසු ගෙවිය යුතු බව පවසා ඔප්පුව ලබා දීම ප්‍රතික්ෂේප කළා. ඉතින් අපි වෙනත් ණය දෙන්නෙකුගෙන් මුදල් ලබාගෙන සමූහ ණය මුදලද ගෙවා දැමූ නමුත්, මූල්‍ය ආයතනය ඔප්පුව ආපසු දීම දිගින් දිගටම ප්‍රතික්ෂේප කරන අතර ඔප්පුව මුදා හැරීම සඳහා දැන් එම ගෲප් එකේ තවත් කාන්තාවන් දෙදෙනෙකු ණය ආපසු ගෙවීම සම්පූර්ණ කිරීම අවශ්‍ය බව පවසනවා. මූල්‍ය ආයතනය මගේ ඔප්පුව තවත් වසර 10කටවත් ඇප වශයෙන් තබා ගනීවි.

ඇය වැඩිදුරටත් සඳහන් කළේ, ඔවුන් විශාල ලියවිල්ලක් රැගෙන පැමිණ, තැන් ගණනාවකට අත්සන් කරන ලෙස ඉල්ලා



## බැරිම තැන මම ගිනිතියාගත්තා!

**සින්නයියා අරුල්වෙල්වි**

හැටන්

මගේ නමට අක්කට තමයි ලෝන් එක අරගෙන දුන්නේ. වාරික ගෙවාගන්න බැරි වුණාම දවල්ට රෑට කියල නෑ, හැම වෙලේම ඇවිත් ඉන්නවා. සල්ලි දෙනකල් යන්නෙ නෑ. එක දවසක් රෑ හතට ආවා. මම කිව්ව සල්ලි නෑ, අක්කට නේ ලෝන් එක අරන් දුන්නෙ එයාගෙන් ඉල්ලගන්න කියලා. එයා කිව්වලු එයාට ගෙවන්න සල්ලි නෑ, මගේ නමට නිසා ලෝන් එක තියෙන්නෙ මගෙන් ඉල්ලගන්න කියලා. මට කිව්වා, හෙට උදේට එනවා, ඒ එනකොට රු. 20,000ක් තියෙන්න ඕන කියලා. නැතිවුණොත් මොනව වෙයිද කියල කියන්න බෑ කිව්වා. ඊට පස්සෙ මම ඕක ගැන කල්පනා කර කර ඉඳලා මමම ගිනිතියාගත්තා!

සිටි අතර, එය ඉංග්‍රිසි භාෂාවෙන් තිබූ නිසා කියවා තේරුම් ගැනීමටවත් නොහැකි වූ නමුත් ජීවනෝපාය ගොඩනගා ගැනීමට අවශ්‍ය නිසා පිටසක්වල භාෂාවක ලියවිල්ලකට වුවද අත්සන් කිරීමට සිදු වුණ බවයි.

ඉහත කී ක්ෂුද්‍ර මූල්‍ය සමාගමේ මෙම ප්‍රවේශය මෙම ණය ලාභීන්ගේ මානව හිමිකම් සම්බන්ධයෙන් ගැටලු කිහිපයක් ඉස්මතු කරයි. කාන්තාවන්ගේ සමූහ ණයවලට අදාළ ණය ගිවිසුමේ ණය පැහැර හැර ඇති වෙනත් පුද්ගලයෙකුගේ ණයක් සඳහා ඇපයක් ලෙස චංචල හෝ නිශ්චල දේපළක් ලබා ගැනීමේ හැකියාව පිළිබඳ ප්‍රතිපාදනයක්, නියමයන් හෝ කොන්දේසියක් අඩංගු වී තිබේද යන්න ගැටලුවකි. මෙම අසාධාරණයන්ට මුහුණ දුන් එවැනි වින්දිතයින්ට නීතිමය සහය ලබා දීමේ අභියෝගය වන්නේ මෙම පීඩාවට පත් කාන්තාවන් ළඟ ණය ගිවිසුම් නොමැති වීම සහ නඩු සඳහා අධිකරණයට ඉදිරිපත් වන තුරු එහි නියමයන් සහ කොන්දේසි තේරුම් ගැනීමට ඔවුන්ට නොහැකි වීමයි.

එක් පාර්ශ්වයකට නොතේරෙන නමුත් කියවා තේරුම් ගත් ලෙස සහතික කර අත්සන් කිරීමට බල කෙරෙන භාෂාවකින් එකඟ වීම කොන්ත්‍රාත් නීතිය උල්ලංඝනය කිරීමක් වන අතර පුරවැසියෙකුගේ භාෂා අයිතියද උල්ලංඝනය කිරීමකි. එබැවින්, ඉහතින් උපුටා දක්වන ලද කථාව, ප්‍රවේශමෙන් විග්‍රහ කළ යුතු සහ විසඳුම් සඳහා උපාය මාර්ග අවශ්‍ය වන ගැටලු මාලාවක් එළිදක්වයි. අපේක්ෂිත විසඳුම්වලට දිළිඳු ප්‍රජාවන්ට ක්ෂුද්‍රමූල්‍ය සේවා සැපයීමේදී අනුගමනය කරන නීති විරෝධී භාවිතයන් නියාමනය කරන ප්‍රතිපත්තිමය වෙනස්කම් අනිවාර්යෙන්ම ඇතුළත් විය යුතුය.

කන්තලේ ප්‍රදේශයේ තවත් ගොවි කාන්තාවක් කියා සිටියේ, "අපගේ ජීවනෝපාය වගාව නිසා ඒ සඳහා රුපියල් ලක්ෂ 4ක ණයක් ගත්තා. නමුත් කොරෝනා වයිරස් ප්‍රශ්නය සහ අනපේක්ෂිත සෞඛ්‍ය ගැටලු නිසා ටික කාලයකින් ණය වාරික ගෙවා ගැනීමට නොහැකි වුණා. කනගාටුදායක කාරණාව නම් නිලධාරීන්. මූල්‍ය සමාගමේ නීතිඥයකු හා මිනින්දෝරුවරයකු යැයි කියන පුද්ගලයන් දෙදෙනකු සමඟ පැමිණ මා ණය නොගෙවන්නේ නම් මගේ ඉඩමේ කොටසක් මැන බලන බවත් එය සමාගමට පවරා දිය යුතු බවත් මට තර්ජනය කළා. මා මගේ ඉඩමෙන් කොටසක් පැවරීම ප්‍රතික්ෂේප කළ විට, ඔවුන් මට බල කළා අපි ළඟ තියෙන ණය මුදලට සම්බන්ධ නැති ත්‍රීවීල් එක දෙන්න කියලා.

ඉහත ප්‍රකාශය කළ පුද්ගලයාට අනුව, නිලධාරීන් එම ණය මුදල නැවත ප්‍රතිව්‍යුහගත කර ඇති අතර, ගැටලුව සමථයකට පත් කිරීම සඳහා රුපියල් 580,000/= ක් ආපසු ගෙවන ලෙස ඇයගෙන් ඉල්ලා ඇත. අවාසනාවකට මෙන්, ඇය දැනටමත් කොපමණ මුදලක් ආපසු ගෙවා ඇත්ද යන්න පිළිබඳ නිසි ලියකියවිලි සහ ඇයගේ නඩුව ඔප්පු කිරීම සඳහා එවැනි ගෙවීම්වල රිසිට්පත් නොමැත. මෙම මූල්‍ය සමාගම්, ණය ආපසු ගෙවීමේදී නිසි ලදුපතක් ලබා නොදෙන අතර ඒ වෙනුවට ඔවුන් නිකුත් කරන්නේ යන්ත්‍රයකින් නිකුත් කරන ලද විස්තර සහිත තීන්ත මුද්‍රණය කර පැය කිහිපයකින් මැකී යන බව පෙනෙන්නට තිබෙන රිසිට්පතකි. ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් හිතාමතාම තමන් සූරාකෑම සඳහා කිසිදු සාක්ෂියක් ඔවුන් ළඟ ඉතිරි නොකර එසේ කරන බව ණය ලබන්නන්ගේ චෝදනාවයි.

ඉහත සඳහන් කළ සිදුවීමෙන් පෙන්නුම් කරන්නේ ප්‍රධාන වශයෙන්ම නියාමනයකින් තොරව ක්‍රියාත්මක වන ආකාරය හේතුවෙන් ණය ලබන්නන් මුහුණ දෙන දැවැන්ත මානසික කම්පනය සහ ප්‍රජාවන් බිය ගැන්වීමට සහ කෙසේ හෝ ආපසු ගෙවීම් සහතික කිරීමට එම ආයතන අනුගමනය කරන නීති විරෝධී ක්‍රමවේදයන්ය. වඩාත්ම ගැටලුකාරී කාරණය වන්නේ ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් මෙම පීඩාවට පත් කාන්තාවන් වෙත එල්ල කර ඇති අනවශ්‍ය පීඩනය දැනටමත් සමාජීය හා ආර්ථික වශයෙන් යටපත් වී සිටින පුද්ගලයින්ට කොපමණ කාලයක් දරා ගත හැකිද යන්නයි.

ත්‍රිකුණාමලයේ සිදුවන සමාජ අසාධාරණකම්වලට එරෙහිව ක්‍රියා කරන සිවිල් ක්‍රියාකාරිකයෙක් ප්‍රකාශ කළේ, ක්ෂුද්‍රමූල්‍ය ආධාරවලින් තම ජීවනෝපාය ගොඩනගා ගැනීමට අවශ්‍ය වූ කාන්තාවන් මේ වන විට ජීවත්වීමේ අයිතිය පවා අතහැර දමා ඇති තත්ත්වයකට පැමිණ ඇති බවත්, ඇතැමුන් දැනටමත් සියදිවි නසාගෙන ඇති බවත්ය. ක්ෂුද්‍ර ණය උගුල බොහෝ ප්‍රදේශවල භයානක ප්‍රශ්නයක් බවට පත්ව ඇත.

කාන්තාවන් මෙම ප්‍රශ්නයට හසු වූ විට ඔවුන් තම දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට පවා ප්‍රමාණවත් අවධානයක් දක්වන්නේ නැත. ක්ෂුද්‍රමූල්‍ය සමාගම් නියෝජනය කරමින් කාන්තාවන්ගෙන් ණය වාරික එකතු කිරීමට ගම්මානවලට පැමිණෙන පුද්ගලයන්ගෙන් සිදුවන ලිංගික අතවර පිළිබඳ චෝදනා එල්ල වන අවස්ථා තිබේ.. නීතිමය සහාය ලබා ගැනීමට සහ විසඳුම් සෙවීම සඳහා බලධාරීන් සමඟ සම්බන්ධ වීමට අප මෙම කාන්තාවන්ට සහාය විය යුතුයි.

ආර්ථිකය සම්බන්ධ ගැටලුවක් සමාජ ව්‍යසනයක් බවට පරිවර්තනය වීම මෙම උපුටා දැක්වීම සාක්ෂි දරයි. එම නිසා බොහෝ ක්ෂුද්‍රමූල්‍ය/ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි එක් විධිමත් ක්‍රියාවලියකට හරවා ගැනීමට කඩිනම් සහ ශක්තිමත් ක්‍රියාමාර්ගයක් අවශ්‍ය බව මෙම කරුණු පෙන්වා දෙයි.

මෙම ලිපියේ මතු කර ඇති ගැටලු විසඳීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ක්‍රියාකාරීව නියැළී සිටින අතර උද්දේශන ක්‍රියාකාරකම් රාශියකට පහසුකම් සලසා ඇත. මෙම ක්‍රියාවලියට විපතට පත් ප්‍රජාවන්ගේ



## ග්‍රාමීය කාන්තාවන්ගේ ජීවිත නගාසිටුවීමට විකල්ප වැඩපිළිවෙළක්

**රවීන්ද්‍ර රණසිංහ**
**සමාජ ක්‍රියාකාරික**
**කන්තලේ**

ක්ෂුද්‍ර මූල්‍ය ණය නිසා මේ ප්‍රදේශවල කාන්තාවන් පත්වෙලා තිබෙන තත්ත්වය ඉතාම ශෝචනීයයි. ඔවුන්ගේ ජීවිත සම්පූර්ණයෙන්ම අවුල් වෙලා. ඇතැම් අය දිවි නසාගන්නා තත්ත්වයට පත්වෙලා. මේ අර්බුදයට විසඳුම් සොයන අතරෙම, මෙවැනි උගුල්වල නොවැටී ඔවුන්ගේ ජීවිත නගාසිටුවන වැඩපිළිවෙළකුත් අවශ්‍යයි.

මම යෝජනා කරන්නේ එක් එක් ගම්වල කාන්තාවන් කණ්ඩායම් වශයෙන් එකතුවෙලා අදාළ ප්‍රදේශයට වඩාත්ම ගැළපෙන නිෂ්පාදන කටයුත්තකට සාමූහිකව යොමු වීම තමයි හොඳම විසඳුම. ඒ සඳහා අවශ්‍ය දැනුම හා පුහුණුව ලබාගෙන සමූහයක් ලෙස එම ව්‍යාපාරය කරගෙන යන්න පුළුවන්. එවිට අලවිය, උපදේශනය ආදිය සඳහා වඩාත් හොඳ පසුබිමක් සැලසෙනවා.

උදාහරණයක් හැටියට එක ගමක් කිරි ගව පාලනය, කුකුළු පාලනය, ඉඟුරු වගාව, කහ වගාව වැනි එක ව්‍යාපාරයක් තෝරාගෙන සාමූහිකව එය කරගෙන ගියොත් වඩා සාර්ථක ප්‍රතිඵල ලබන්න පුළුවන්.

මානව හිමිකම් අවබෝධ කර ගැනීම සඳහා ඔවුන්ගේ ධාරිතාව වර්ධනය කිරීම, නීතිමය සහ ප්‍රතිපත්තිමය විශ්ලේෂණයන් කිරීම යන මැදිහත්වීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ආණ්ඩුකාරවරුන් සහ පළාත් ආණ්ඩුවල නිලධාරීන්, පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය සහ පරිපාලන පද්ධතියේ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් ඇතුළු දිස්ත්‍රික් ලේකම්වරුන් සමග කෙරෙන උද්දේශන උත්සාහයන්ද ඇතුළත් වේ.

පුළුල් උද්දේශන උපායමාර්ගයේ කොටසක් ලෙස, ණය නියාමක අධිකාරී පනතක් වෙත යාමට බලපෑමක් ඇති කිරීමට මහජන ව්‍යාපාරයක් ගොඩනැගීමට ඇති වෙනත් අවස්ථා ගවේෂණය කරන අතරම ප්‍රතිපත්ති සම්පාදකයින්ට වහාම ක්‍රියා කරන ලෙස බලපෑම් කිරීමට මෙම කාරණය පාර්ලිමේන්තුවට ගෙන ඒමට අපේක්ෂා කෙරේ. විශේෂයෙන් රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවේ සහ කාන්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදයේ අවධානය මේ සඳහා යොමු විය යුතුය. මීට අමතරව, ක්ෂුද්‍ර මූල්‍ය/ක්ෂුද්‍ර ණය සේවාවන්හි සේවා සපයන්නන්ට සහ සේවා ලබන්නන්ට



## අගතියට පත් කාන්තාවන්ට නීතිමය රැකවරණය ලබා දීමත්, ඔවුන්ගේ ආර්ථිකය නගා සිටුවීමත් අපේ අරමුණයි

**සුරංග රූපසිංහ**
*ජාතික සහයෝගිතා පදනම*
*කන්තලේ*

අපි දැනට වසරක් පමණ තිස්සේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එක්ක එකතුවෙලා පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල වැඩසටහනක් ක්‍රියාත්මක කරගෙන යනවා, මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැටලුවට මුහුණ පෑ කාන්තාවන් වෙනුවෙන්. මේ මූල්‍ය සමාගම් මේ වගේ ප්‍රදේශවල කාන්තාවන් සීයට අනූපහක් විතර මේ ණය උගුලෙ හිර කර තිබෙනවා. අපි මූලික වශයෙන් මේ කාන්තාවන්ට නීතිමය පැත්තෙන් අවශ්‍ය පිළිසරණ ලබා දෙන්න කටයුතු කරගෙන යනවා. ඒ වගේම ග්‍රාමීය වශයෙන් තිබෙන මෙවැනි ගැටලු හඳුනාගෙන මානව හිමිකම් කොමිෂන් සභාව, තොරතුරු කොමිසම වැනි ආයතනවල පිහිට පතමින් එම ගැටලුවලට විසඳුමක් සෙවීම සඳහා තමයි අපි ක්‍රියාත්මක වෙන්නේ.

අපි දැනටමත් ශ්‍රී ලංකා මහ බැංකුවට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා මේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල අනිසි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්. ඒ වගේම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවටත් පැමිණිලි කර තිබෙනවා.

ඒ වගේම අපි බලාපොරොත්තු වෙනවා මේ ග්‍රාමීය කාන්තාවන්ගේ ආර්ථිකය නගාසිටුවීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ග්‍රාමීය කාන්තාවන් මෙවැනි ආයතනවල ගොදුරු බවට පත් නොවී, ඔවුන්ගේම සංවිධාන ඔස්සේ ස්වයංව ක්‍රියාත්මක වන ණය ක්‍රමයක් වගේ දේවල් යෝජනා වෙලා තියනවා.

ඔවුන්ගේ පරමාදර්ශී අරමුණු සාක්ෂාත් කර ගැනීමට අඩු ආදායම්ලාභී ප්‍රජාවන්ට සහාය වීමට සහ දරිද්‍රතාවට එරෙහිව සටන් කිරීමට පහසුකම් සැලසෙන ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට බලධාරීන්ට බලපෑම් කරනු ඇත.

## ක්ෂුද්‍රමූල්‍යකරණය අඩු ආදායම්ලාභී කණ්ඩායම්වල ජීවනෝපාය නැවත ගොඩනඟා ගැනීමට උපකාර වන්නේ කෙසේද?

ඉහතදී නැවත නැවතත් අවධාරණය කර ඇති පරිදි, සමාජයේ දිළිඳු සහ අඩු ආදායම්ලාභී කොටස්වල ජීවනෝපාය නැංවීම සඳහා ක්ෂුද්‍රමූල්‍යකරණයට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ හැක. කෙසේ වෙතත්, ව්‍යවස්ථාදායකයන් ඇතුළු අදාළ බලධාරීන් මතුවෙමින් පවතින මූලික ගැටලුවලට විසඳුම් ලබා දෙන තුරු එවැනි අපේක්ෂාවක් බලාපොරොත්තු ලෙස පමණක් පවතිනු ඇත. එබැවින්, පහත සඳහන් නිර්දේශ මෙම ලිපියේ කෙටියෙන් නිදර්ශනය කර ඇති පුළුල් සමාජ-ආර්ථික ගැටලුවලට අදාළ සමහර කාරණාවන් පමණි. ශ්‍රී ලංකාවේ නියාමනය නොකළ ක්ෂුද්‍රමූල්‍ය ක්‍රියාකාරකම් සඳහා කල්පවත්නා විසඳුම් සෙවීමේදී වැඩිදුර පර්යේෂණ සිදු කළ යුතුය.

1. ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍රමූල්‍ය, ක්ෂුද්‍ර ණය සහ අනෙකුත් මූල්‍ය ණයවලට සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් ඇතුළත්, ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සහිත ජාතික ප්‍රතිපත්ති රාමුවක් සැලසුම් කිරීම.
2. වින්දිත ප්‍රජාවන් සමඟ අවශ්‍ය සාකච්ඡා පවත්වා යෝජිත ණය නියාමන අධිකාරී පනත අනුමත කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය අංශයේ කාර්යයන් අර්ථවත් ලෙස ප්‍රමිතිගත කරන ඵලදායී සහ ශක්තිමත් නියාමන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට අදාළ විධිවිධාන එවැනි නීති සම්පාදනයට අනිවාර්යෙන්ම ඇතුළත් විය යුතුය. එවැනි



### කිසිම සොයාබැලීමක් නැතිව තරගෙට ණය දුන්නා

**කාන්ති ජයමහ**
ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, කන්තලේ

ණය වාරික හිඟ තිබුණාම, මේ ක්ෂුද්‍රමූල්‍ය ආයතන නියෝජනය කරන නිලධාරීන් මේ කාන්තාවන්ගේ ගෙවල්වලට නිතර නිතර ගිහින් ඒ අය පීඩාවට පත් කරනවා. ක්ෂුද්‍රමූල්‍ය ආයතන යම් ණය මුදලක් දෙනකොට ඒක කරන්න ඕන යම්කිසි ස්වයං රැකියාවක් සඳහායි. නමුත් මේ අය කිසිම සොයාබැලීමක් නැතිව ණය දීල මේ කාන්තාවන් අමාරුවේ දාල තියෙන්නෙ. හතු පිපෙන්නා වාගේ බිහිවෙන මේ ආයතන ගම්වලට ඇවිත් තරගකාරී විදියට ණය දෙන්න පටන්ගත්තා. මහ බැංකුව මේවා නතර කරන්න ඕන. අසරණ වෙච්ච කාන්තාවන්ට සාධාරණයක් ඉටු වෙන්න ඕන.

නියාමන ප්‍රතිපත්තියක් මගින් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ආධාර ලබා ගැනීමට බලාපොරොත්තු වන අඩු ආදායම් ලබන ප්‍රජාවන්ව පුද්ගලයන් විසින් හෝ ආයතන විසින සූරාකෑමට ලක් වීම වැළැක්විය යුතුය.

3. ක්ෂුද්‍රමූල්‍ය පනත, මූල්‍ය ව්‍යාපාර පනත හෝ ඒ යටතේ නිකුත් කිරීමට නියමිත ඕනෑම අනාගත නීති මගින් රෙගුලාසි සඳහා වන නිර්ණායකවලදී මුදල් ණයට දීමට හැකි ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල සේවා ලබන්නන්ගේ භාෂා අයිතිවාසිකම්වලට ගරු කිරීම සඳහා මාර්ගෝපදේශ ඇතුළත් විය යුතුය. අත්සන් කරන්නන්ට කියවා තේරුම් ගත නොහැකි භාෂාවකින් ඉදිරිපත් කර ඇති අසාධාරණ ගිවිසුම් සහ කොන්දේසි 1997 අංක 26 දරන අසාධාරණ ගිවිසුම් කොන්දේසි පනතේ නියම කර ඇති විධිවිධාන උල්ලංඝනය කිරීමක් ලෙස පිළිගත යුතුය.



## මහ බැංකුව වගකීම පැහැර හැරලා

**නීතිඥ සුනෙත් ආර්. විමලසිරි**
කන්තලේ

ක්ෂුද්‍රමූල්‍ය ණය කියන්නෙ ග්‍රාමීය ජනතාව නගාසිටුවීම සඳහා භාවිත කළ හැකි ඉතා වැදගත් උපායමාර්ගයක්. ඒත් ලංකාවේ මේ ණය ක්‍රමය ඔස්සේ සිදු වුණේ ග්‍රාමීය ජනතාව නගාසිටුවීම වෙනුවට මූල්‍ය ආයතන පොහොසත් වීමයි. ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය ණය නිසා ග්‍රාමීය කාන්තාවන්ගෙන් අතිවිශාල පිරිසක් ගැලවීමට අපහසු ණය උගුලක සිර කර තිබෙන අතරම ඒ නිසා තවත් සමාජයීය ගැටලු රැසක් ඇති කර තිබෙනවා.

සමහර ආයතන, මහ බැංකුවේ අනුමත පොලී අනුපාතිකයට වඩා ඉතා ඉහළ වාර්ෂික පොලී අනුපාතයක් අය කර තිබෙනවා. අපට හමු වූ ඇතැම් ගිවිසුම්වලට අනුව 40%ක පමණ පොලියක් අය කළ අවස්ථාද තිබෙනවා. ඒ වගේම මේ ණය දී තිබෙන්නේ ඔවුන්ගේ දිළිඳුකම නැති කරන, ආදායම් උපයන කටයුතු සඳහා නෙවෙයි. ශීතකරණයක් ගන්න, රූපවාහිනියක් ගන්න, රත්රන් බඩු බේරගන්න වගේ කාරණාවලටත් ණය ලබා දී තිබුණා.

ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන නියාමනය කිරීමේ වගකීම දරන ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් අමාත්‍යාංශය ඇතුළු රාජ්‍ය ආයතනවල වගකීම් විරහිතභාවය මේ අර්බුදය මෙතරම් වර්ධනය වීමට ප්‍රධාන හේතුවක්.

ණය වාරික ගෙවාගැනීමට නොහැකි තත්ත්වයට පත් වූ කාන්තාවන්ට, ණය එකතු කිරීමට එන නිලධාරීන් ලිංගික බලපෑම් සිදු කරන අවස්ථා පිළිබඳව පවා වාර්තා වෙනවා. මේ ගැන අපට අදාළ කාන්තාවන් දිවුරුම් ප්‍රකාශ පවා ලබා දී තිබෙනවා.

මේ මූල්‍ය ආයතන, රු. ලක්ෂයකට අඩු ණය සඳහා පවා නඩු පවරා තිබෙනවා. මේ වගේ අවස්ථාවල වින්දිත කාන්තාවන් දැඩි අසරණ තත්ත්වයට පත් වෙනවා. සමහරවිට ඔවුන්ට ණය මුදලට වඩා ගණනක් නීතිඥ ගාස්තු වශයෙන් වැය කරන්න සිදු වෙනවා.

4. වසංගතය මධ්‍යයේ ක්ෂුද්‍ර ණය ණය කපා හැරීමේ සහනදායී යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අතිශයින් සංකීර්ණ වන අතර එම නිසා එම ණය සහනය පහසු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සහ හිදැස්, අභියෝග සහ උගත් පාඩම් හඳුනා ගැනීමට පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීමට මහ බැංකුව සහ අනෙකුත් රාජ්‍ය ආයතන වහා පියවර ගත යුතුය. කෝවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් තම ආදායම අහිමි වූ ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යාපාරවල නියැලී සිටින ග්‍රාමීය සහ ආන්තික ස්වයං රැකියාලාභී කාන්තාවන් මුහුණ දෙන අසාධාරණකම් නිවැරදි කිරීම සඳහා ක්‍රියා මාර්ග ගත යුතුය.
5. දිස්ත්‍රික් පරිපාලන යන්ත්‍ර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සංඛ්‍යාලේඛන අංශය, මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සහ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිසි සහයෝගය සහ සහයෝගීතාව ඇතිව, ක්ෂුද්‍ර ණය ප්‍රශ්නවල සිර වී සිටින පුද්ගලයින් පිළිබඳ තක්සේරුවක් සිදු කළ යුතු අතර බලපෑමට ලක් වූවන්ගේ ප්‍රජාවන්හි සාක්ෂි පදනම් කරගත් දත්ත රැස් කළ යුතුය..
6. ජීවනෝපාය සංවර්ධනය සඳහා ක්ෂුද්‍රමූල්‍ය සහාය අපේක්ෂා කරන දිළිඳු සහ ආන්තික ප්‍රජාවන් නිරීක්ෂණය කිරීම, අධීක්ෂණය කිරීම, ඇගයීම සහ උපදෙස් දීම සඳහා පරිපාලන පද්ධතිය තුළ දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ කේන්ද්‍රස්ථාන ලෙස කටයුතු කිරීමට නිලධාරීන් පත් කිරීම.
7. ස්වයං රැකියා සහ විවිධ ව්‍යවසායකත්වය තුළින් තම ජීවනෝපාය නැවත ගොඩනගා ගැනීමට ප්‍රජාවන්ට අවශ්‍ය වන මූල්‍ය ආධාර පිළිබඳව තක්සේරුවක් සිදු කිරීම
8. කුඩා ව්‍යවසාය සංවර්ධන, සමෘද්ධි, සමාජ සංවර්ධන, කාන්තා හා ළමා කටයුතු සහ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සමාජ ඒකාබද්ධ කිරීම භාර නිලධාරීන් ග්‍රාමීය හා දිළිඳු ප්‍රජාවන් සමඟ විශේෂයෙන් ක්ෂුද්‍ර ණය පදනම් කරගත් මූල්‍ය සේවාවල මූල්‍ය ආධාර මත පදනම් කරගත් කාන්තාවන්ගේ ජීවනෝපායවලදී වඩාත් ක්‍රියාශීලී ලෙස සම්බන්ධ වීම සහ අධීක්ෂණය කිරීම සහතික කිරීම.
9. භාෂා අයිතිවාසිකම්, අසාධාරණ ගිවිසුම්, කොන්දේසි, නීති විරෝධී ණය වාරික එකතු කිරීමේ ක්‍රම, කාන්තා අයිතිවාසිකම්, පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය සහ අසාධාරණ ගිවිසුම් කොන්දේසි වැනි අයිතීන් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමේදී, රට පුරා මානව හිමිකම් කොමිසමෙහි ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන් සහ නීති ආධාර කොමිෂන් සභාව සමඟ ඔවුන්ගේ සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය පරිපාලනයේ නිලධාරීන් කටයුතු කිරීම.

# ක්ෂුද්‍රමූල්‍ය බාඳුරා ගොටුවේ සිර වූ ආදිවාසී කාන්තාවෝ

**ලක්මාල් බදුගේ**

වෙල්ලස්ස හා බිම්තැන්නේ දඹාන කේන්ද්‍ර කරගෙන සිය සංස්කෘතිය රැක ගනිමින් වනාන්තර ආශ්‍රිතව ජීවත් වූ වැදි ජනයාට සිය නිජබිම් හැර යෑමට සිදු වූයේ විවෘත ආර්ථිකය සමග මෙරට විසිරුණු සංවර්ධනයේ අරුණලු හේතුවෙනි. එකී අරුණැල්ල වැදි ජනයාගේ සංස්කෘතිය, ජීවන මාර්ග හා නිජබිම් පුළුස්සා දැමූ ගිනිදැල්ලක් වූවා මිසක කිසිවිටෙක ඔවුන්ගේ ජීවිතෙවලට ආලෝකය උදා කර නොදුන්නේය. ඔවුන්ගේ ජීවිත සංවර්ධනය නිසා හටගත් ගිනි දළුවල යෝධ සෙවණැල්ලෙන් වැසී ගියේය.

හිතුමනාපයේ මංගැච්චු රුකුල් පොජ්ජවල් අභය භූමි හා වනෝද්‍යාන බවට පත්ව 80 දශකයේදී වැදි ජනයා ඒ බිමෙන් බලහත්කාරයෙන් පන්නා දැමිණි. මේ නිසා ඔවුන්ට දඩයම හා පැණි කැඩීම තහනම් විය. දඩයම හා බැඳී තිබුණු බොහෝ සංස්කෘතික යුතුකම්ද නෑ යකුන් පිදුම වැනි චාරිත්‍රද අත්හැරී ගියේ කාලයක් පුරාවට ඒවා ඉටු කළ වනාන්තර තුළට වැදීම ආණ්ඩුවේ මහ හූරන් විසින් නීති හා අණ පනත් මගින් තහනම් කිරීම හේතුවෙනි.

මේ නිසාම සිය ජීවිකාව ගෙන යෑමට බොහෝ දෑ කිරීමට වැද්දන්ට සිදුව තිබේ. දිඹුලාගල, දලුකාන තරුණ වැදි නායකයා ජීවත්වීමට කොන්ක්‍රීට් අනයි. ඔහුගේ රැහේ සෙසු තරුණයන්ද ජීවත්වීමේ අරගලය තුළ කුලී වැඩ කරති. පරම්පරා ගණනාවක් ජීවත් වූ දිඹුලාගල මහ වනයේ ගල් ලෙන් බුදු පුතුනට පූජා කොට පාරම්පරික ගල්ගෙය මෙන්ම සිය බඩවියතද අහිමි කරගෙන කඳු බැසි මේ මිනිස්ගජ්ජු ජීවත්ව සිටිත්දෝ කුමක් කරද්දෝ කොහි ඇත්දෝ යන්න කිසිවකු සොයා නොබැලීම හේතුවෙන් බොහෝ අසරණව දිවි ගෙවති.

## කොම්පැනි හූරලාගේ පහසු ගොදුරු

ආණ්ඩුවේ වගකිවයුත්තන් සිය වගකීම් පැහැර හැරීම නිසා දරිද්‍රතාවයේ ගොදුරක් බවට පත්ව ඇති වැදි ජනයා ගොදුරු කර ගැනීමට, දශකයකට පෙර හතු පිපෙන්නාක් මෙන් මෙරට පිපී ගිය ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ද ඉව අල්ලනුයේ මෙවැනි පසුබිමකය. වැදි ජනයා සොයා ඇත නියම්ගම් තුළට වැදුණු මෙම සමාගම් සිය රාජකාරිය යුහුසුලුව අරඹා තිබේ. මළපොතෙහි අකුරක් බැරි වැදි ජනයා සිය පහසු ගොදුරු ලෙස හඳුනාගෙන ඇති මෙම සමාගම් හෙනිනාගල, අම්පාර-පොල්ලෙබැද්ද, ගල්වල යාය හා දිඹුලාගල-දලුකාන වැදි ජනයා උපක්‍රමශීලි අයුරින් සිය ණය උගුලෙහි ගොදුරක් බවට පත් කර ගෙන ඇති අයුරු පෙනීයයි.

රක්ෂිත වනාන්තර තුළට පිවිසීම තහනම් වීමත්, වගා කිරීමට කුඹුරු ඉඩම් නොමැතිකමත් නිසා මේ වැදි ජනයා බොහෝ අසරණව ආර්ථික වශයෙන් පීඩාවට පත්ව සිටිති. පැණි

කැඩීමට හා කටු අල හැරීමට පමණක් කැලෑ වැදීමට යම් ලිහිල් බවක් පැවැතීම ජීවත්වීමට කිසියම් අස්වැසිල්ලක් බැව් ඔවුහු කියති. වගාවක් කෙරුමට හෝ ඉඩමක් නොමැතිකමින් පීඩා විඳින අම්පාර ගල්වලයාය වැදි ගමෙහි කාන්තාවන් රැසක්ම ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල ගොදුරු බවට පත්ව සිටිති. රුපියල් 30,000 කින් පටන් ගන්නා කණ්ඩායම් ණය ඇතැම් සමාගම් සති වාරික ලෙස අය කරයි. ඇතැම් සමාගමක් සිය වාරිකය මාසිකව අය කර ගනී. කෙසේ වෙතත් අකුරු නොදන්නා මේ මිනිසුන් ඔවුන් පහසුවෙන් ගොදුරු කර ගනුයේ ඔවුන්ගේ ජීවිත වටා දැවටී ඇති දරිද්‍රතාවයේ සෙවණැල්ල හේතුවෙනි.

*"ඉස්සර දඩයමේ ගියාට දැන් යන්න බෑ. වනජීවියෙනුයි පොලිසියෙනුයි අල්ලලා දඩ ගහනවා ඒ නිසා කුඹුරු කරන්න කියලා හිතාන ණය ගත්තා. කච්පි හිටෙව්වා, ඒවා නියං සායට අහුවුණා. ගෙවා ගන්න බැරිවුණා. දැන් නඩු දානවා කියනවා. ලියුම් කරදහි එනවා ඒවායේ තියෙන්නේ මොනාද කියන්න දන්නෙ නෑ"*

එසේ පවසන 37 හැවිරිදි තලා බණ්ඩාරලාගේ චන්ද්‍රනි, අම්පාර, පොල්ලෙබැද්ද, ගල්වල යාය වැදි ගමෙහි ණයට ගොදුරුව ඇති එක් කාන්තාවකි.



## පොතට කියල කපපු හැටදාහ පොතේ නැහැ!

**තලා වරිගේ කුසුමාවතී**

හෙනානිගල දකුණ

මිස් කෙනෙක් බැංකුවෙන් ආවා. කණ්ඩායම් හැදුවා. ගිණුම් ආරම්භ කරලා ණයක් ගන්න පුළුවන් කිව්වා. ඊට පස්සේ අපිත් කණ්ඩායම් හැදිලා ගිණුම් ආරම්භ කරලා ණය ගත්තා. ගේ බාගෙට හදල තිබුණේ. ඉතිරි ටික හදාගන්න කියලා රුපියල් ලක්ෂ දෙකක් ගත්තා. ඒකෙන් පොතට කියලා හැටදාහක් කපාගෙන ඉතිරි ටික තමා දුන්නේ. අවුරුදු දෙකක් විතර ගෙවාගෙන ගියා. ඊට පස්සේ ගොඩක් ආර්ථික අපහසුතා ඇති වුණා. මහත්තයට රස්සාවක් තිබුණෙත් නැහැ. වැවේ ගියේ. ඒ ගිහිල්ලා වනජීවී එකට අහුවෙලා ඒවට නඩු ගිහිල්ලා එවට ගෙවලා යනකොට අතපසු වුණා. මම ණය ගත්තේ ආර්.ඩී.බී. බැංකුවෙන්. ළඟදි ලියුමක් ආවා, ඒකේ මට ගෙවන්න තිබුණේ පනස් දාස් ගාණක්. පොලියත් ඒක්ක අසූහය දාස් ගාණක් ගෙවන්න ඕන කියලා තිබුණා. මම පොත මාක් කරලා බැලුවා, පොතේ අර හැටදාහ තිබුණේ නැහැ.

අසාධාරණ විදියට පොලියක් අය කරනවා කියලා පස්සේ තේරුණා. පොලියටත් එක්ක පොලී හැදුවා. මටත් එච්චර හොඳට අකුරු බැහැ. ඒ නිසා කියවලා බලන්නේ නැතුව තමා මේවට අත්සන් කළේ. ඉතුරු සල්ලි ගෙවන්න විදියක් නැතුව තමා දැන් ඉන්නේ. නඩු දානවා කියලා ලියුමක් ආවා. නඩු දැම්මොත් ඉතින් යන්න වෙනවා. ආණ්ඩුවේ බලධාරීන්ගෙන් ඉල්ලන්න තියෙන්නේ අපේ මේ ණයවල් කපලා දානව නම් හොඳයි කියලා තමා.

කතුන් පමණක් ඉලක්ක කර ණය දෙන ක්ෂුද්‍රමූල්‍ය සමාගම් මුලින්ම කරන්නේ කුඩා කණ්ඩායම් ඇටවීමයි. එකම පවුලේ අයට ණය නොදීම සම්මතය යැයි කීවද, ආර්ථිකය නගා සිටුවීමට උපකාරයක් ලෙස යැයි එකම රැහේ අයට ණය දී වැදි ජනයාද සෙසු ගැමි කාන්තාවන් සේම ණය උගුලකට සිරකර ඇති සැටි පෙනී යයි.

*"රුපියල් ලක්ෂයක් ගත්තා. සතියකට 2650ක් ගෙවන්න ඕන. ඒ මහත්වරු ආවම රුපියල් 500ක් විතර දෙනවා. මොනා කරන්නද කියලා අපි දන්නෙ නෑ මහත්තයා. කුලී වැඩට යනවා ආයෙ වගාවක් කරන්න සල්ලිත් නෑ. කැලේ යන්නත් බෑ. අපිට ඉඩමක් ඇත්තෙත් නෑ."*

ගල්වල යාය වැදි ගමෙහි කාන්තාවක වන 23 හැවිරිදි තලා බණ්ඩාරලාගේ පුංචි මැණිකා රුපියල් 50,000ක ණයක් නිසා ණය උගුලේ සිර වී ගෙවාගත නොහැකිව සිටියි.

## රෝගී කාන්තාවකටත් ණයක්

ක්ෂුද්‍ර මූල්‍ය ණය සමාගම්වල ගොදුරක් බවට මන්දමානසික තත්ත්වයකට ප්‍රතිකාර ලබන වැදි කතකද ගොදුරුව සිටී. ගල්වල යාය ගමෙහි කෝරලේ ගමගේ ශ්‍රියාකාන්ති පෙරේරා නම් 50 හැවිරිදි මෙම කාන්තාව රවටා අත්සන් ගෙන ණය ලබා ගැනීමට කණ්ඩායමේ වෙනත් අයෙකු කටයුතු කර ඇති බව ඇය කියයි.

*"බණ්ඩාර මැණිකෙට තමා මම ණය අරන් දුන්නෙ. මම අස්සන් කළා. පස්සෙ මට ලියුම් කරදහි*



## නඩු දැම්මොත් හිරේ යන්නයි වෙන්නෙ!

**ඌරු වරිගේ විමලාවතී**
හෙනානිගල ආදිවාසි ගම්මානය

මගේ මහත්තයා වැව් රස්සාව තමා කරන්නේ. තව කැලේ යනවා මීපැණි කඩන්න. ඒ ගිහිල්ලා ගහකින් වැටිලා අත කැඩුණා. පස්සෙ තවත් ලෙඩ වෙලා ඇඳටම වැටුණා. මම කොමර්ෂල් ක්‍රෙඩිට් එකෙන් රුපියල් ලක්ෂයක ණයක් අරගෙන තිබුණා. ගෙවාගෙන ගෙවාගෙන ගිහින් තව තිස් හත්දාහක් මට ගෙවන්න තියෙනවා. එක පාරක් ලියුම් ආවා ගෙවන්න කියලා. අපේ මහත්තයාගේ අසනීපෙ නිසා මට ගෙවන්න බැරි වුණා. දැන් නම් කොහොමවත් ගෙවාගන්න හැටියක් නැහැ.

ගෙදරටම ඇවිත් තමා ණය දුන්නේ. ගෙදරදිම අත්සන් අරගෙන. හතර දෙනෙක් ඇපයට තියාලා තුන්දෙනා තුන්දෙනා එකතු වෙලා තමා ණය ගත්තේ. ඊට අදාළ කිසි දෙයක් කියෙව්වේ නැහැ. කියවන්න අකුරු දන්නේ නැති නිසා.

බැරිවෙලාවත් දැන් නඩු දැම්මොත් ගිහින් හිරේ ඉන්න තමා වෙන්නේ. වෙන මොනවා කරන්නද? සමෘද්ධියත් නෑ. කුලියක් නෑ, කිසිම රැකී රස්සාවක් නෑ අපේ ගමට. රජයකින්වත් අපට දීලා නැහැ කිසිම දෙයක්. මේ ණය කපා හැරලා ගමට රස්සාවක් ලැබෙන පිළිවෙළක් හදල දෙනව නම් අපට සහනයක්.

*ආවා ගෙවන්න කියලා. ණය දෙන මහත්තුරු ගෙදරට ආවා. නඩු දානවා ඒ නිසා ගෙවන්න කියලා කිව්වා"* යැයි ඇය පවසයි.

ණය ලබාදුන් ආයතනය නිසි ඇගයීමක් කළේ නම් මෙවැනි රෝගී තත්ත්වයකින් පසුවන කතකට ණය ගිවිසුම් අත්සන් කිරීමට නොහැකි වන්නේය. ඇය දන්නේ අත්සන් කිරීමට පමණකි. ඇය පමණක් නොව ඇගේ කණ්ඩායමේ සෙසු අයද අකුරු නොදනිති.

ණය ගත් වැදි රහේ ඇත්තියන් පැවැසුවේ ණය දෙන මහත්වරුන් පුරවා දුන් කරදහි පෝරම්වල අස්සන් ගැසූ බව පමණක් තමන් දන්නා බවය.

හෙනානිගල වැදි ගමෙහි කාන්තාවක වන ඌරුවරිගේ අනුලාවතී පැවැසුවේ මසුන් ඇල්ලීම සඳහා සිය සැමියාට දැල් ගැනීමට ණය ගත්තද ඒවා සිය පවුලේ පරිභෝජන කටයුතු සඳහා වියදම් වීමෙන් ණය ගෙවා ගැනීමට නොහැකි වූ බවයි.



## වාරිකේ දෙනකල් මිදුලෙ රැකගෙන ඉන්නවා

**ඌරු වරිගේ අනුලාවතී**

කොමර්ෂල් ක්‍රෙඩිට් එකේ මහත්තුරු මෙහේ ඇවිත්, දහ දෙනෙක් විතර එකතු කර ගන්න කියලා කිව්වා. මම තමා කට්ටිය එකතු කළේ. එකතු වෙලා අපි ණය ගත්තා. මුල් වතාවේ මම පනස්දාහක් ගත්තා. ඊට පස්සේ ලක්ෂයක් දුන්නා. කොළ පුරවලා අත්සන් කරන්න කිව්වා. ඒ කොළ තිබුණේ මොන බාසාවෙන්ද කියලවත් දන්නෙ නැහැ. අකුරු දන්නේ නැති නිසා. ලක්ෂෙ ණය අරගෙන හැටදාහක් විතර ගෙවාගෙන යනකොට ඉතිරි ටික ගෙවා ගන්න බැරි වුණා. පස්සෙ සමථ මණ්ඩලයට යන්න කියල ලියුම් ආවා. ඒකට ගියාම කිව්වා පුළුවන් විදියට, හොයා ගන්න විදියට සල්ලි දාන්න කියලා. එහෙම ගෙවාගෙන යද්දි, තව විසි දාහක් විතර තියෙනකොට ඒ අය අපට ලියුම් එවලා තිබුණා ණය කපා හැරලා තියෙන්නේ කියලා. ඊට පස්සේ ණයක් ගත්තේ නැහැ.

මේ හැම ණයකටම අපි ලොකු පොලියක් ගෙවලා තියෙනවා. අද දෙන වාරිකේ නෙමේ තව සතියකින් ඇවිත් ඒ අය ඉල්ලන්නේ. අපි හරියට අකුරු දන්නේ නැහැ. එයාල පොතේ ලකුණු කරන එක තමා කාට හරි කියලා බලවා ගන්නේ. බොරු ගණන් ලකුණු කරලා තිබුණත් අපි දන්නෑ. රජයේ බැංකුවලින් අපිට ණය දුන්නේ නැහැ. එතකොට තමා ඔය ආපු අයගෙන් අපි ණය ගත්තේ.

ණය ගෙවන්න පරක්කු වෙනකොට ඒ අය ගෙවල්වලට ඇවිත් කරදර කරනවා. වාරිකේ දුන්නේ නැත්නම් යන්නෙත් නැහැ, මිදුලෙ රැකගෙන ඉන්නවා. රෑත් ඇවිත් කරදර කරනවා. කොහොම හරි වාරිකේ ඕන කියනවා. කාගෙන් හරි අතමාරුවක් ගන්න පුළුවන් වුණොත් අරන් දෙනවා නැතිවුණොත් බැණුම් අහගෙන ඉන්නවා. නැත්තං කොහොම දෙන්නද?

*"කලින් 50,000ක් ගත්තා, ඒක ගෙව්වා. පස්සෙ 100,000ක් ගත්තා. 60,000ක් ගෙව්වා, ඉතිරි ටික තමා ගෙවාගන්න බැරි වුණේ. දැන් නඩු දානවා කියලා කිව්වා, මොනා කරන්නද ඉතින්"* යැයි ඇය පවසයි.

ක්ෂුද්‍රමූල්‍ය උගුලට සිර වී ඇති තවත් වැදි ගමක් වනුයේ හෙනානිගලයි. ගැටලුව විසඳීමට රැහේ නායක ඇත්තන්ටද නොහැකිව තිබේ. ඒ රැහේ සෙසු මිනිස් ගජ්ජන් වෙළී ඇති දුප්පත්කම නිසා ඇතිව තිබෙන ආර්ථික ගැටලු, ණය ගැනීමට බල කෙරෙන තැනට රැහේ ඇත්තන් පත් කර ඇති හෙයිනි. හෙනානිගල වැදි ජනයා අතරද බොහෝ පිරිසක් ණය උගුලට ගොදුරුව සිටිති.

## දලුකානත් ණය උගුලේ

දිඹුලාගල, දලුකාන වැදි ජනයාද ක්ෂුද්‍රමූල්‍ය ණයෙහි ගොදුරක්ව ඇති බව එහි ආදිවාසි නායක තලාවරිගේ ප්‍රියන්ත ඇත්තන් පවසයි. ඔහු පවසනුයේ වනජීවී නිලධාරීන් හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සිය පාරම්පරික වනාන්තර පෙදෙසට පිවිසීම අවහිර කිරිම නිසා තමන්ගේ රැහේ ඇත්තන් මෙම ණය උගුලෙහි ගොදුරු බවට පත්ව ඇති බවයි.



## කන්නවත් නැතුව කොහොමද ලෝන් ගෙවන්නේ?

**පී. අජන්තා**

බැංකුවෙන් ගමටම ඇවිත් තමා ණය දුන්නේ. අපිත් ෆෝම් පුරවලා ණය ගත්තා. මම ණය ගත්තේ ගේ හදන්න. මගේ මහත්තයා කුලී වැඩ තමා කරන්නේ. මැටියෙන් තමා ගේ හදලා තිබ්බේ. පස්සේ ගඩොල් කපලා කාමර දෙකක් හැදුවා.

ලක්ෂ එකහමාරෙ ණයට, මාසෙ වාරිකය අටදාස් හත්සීයක් ගෙව්වා. මම අකුරු ලියන්න කියවන්න දන්නවා. ඒ ලිපි ලේඛන තිබ්බේ සිංහලෙන්. කණ්ඩාමේ ඉන්න තුන්දෙනාගෙන් එක්කෙනෙක් තමා පුරවන්නේ. ඒ නිසා මං පිරෙව්වේ නැහැ. අපි අත්සන් කරලා බැංකුවට දුන්නම ලෝන් ඒක පාස් වෙනවා. ඒ ෆෝම්වල තිබ්බේ මොනවද කියලා එච්චර ගාණක් නම් නැහැ.

වැඩක් පලක් කුලියක් වත් නැතිවුණාම ගෙවා ගන්න බැරි වුණා. දැන් ඇරියස් වෙලා. එයාලා ලෝන් එකතු කරන්න එනවා. ගෙවන්න නෑ කිව්වම එයාලා ගියා. දැන් මොනව කරලද දන්නේ නැහැ. නඩු දැම්මොත් උසාවි යන්න වෙනවා. කුලී වැඩක්වත් නැතිව ජීවත් වෙන්නවත් නැතුව ඉන්නේ. ඉතින් කොහොමද ලෝන් ගෙවන්නේ? ලයිට් බිල් වතුර බිල් ගෙවන්නත් ඕන. ඒවත් වැඩියි. ළමයි ඉස්කෝලේ යවන්නත් ඕන. ඒ ඔක්කොම කරද්දි ලෝන් ගෙවන්න බැරි වෙනවා.

එන විදියට මුහුණ දෙනවා. ණය කපල  දාන්වන නම් හොදයි. මොනව කරයිද කියලා කවුද දන්නේ?

*"අපේ රැහේ 200ක් විතර ඉන්නවා ගොඩාක් අය කුලී වැඩ කරන්නේ. වෙන කරන්න දෙයක් නැති නිසා, මමත් කොන්ක්‍රීට් අනන්න යනවා. සමහර දවස්වල කොළඹ වැඩවලටත් ගියා. ජීවත්වෙන්න විදිහක් නැති නිසා ගොඩාක් අය ගමට ඇවිත් දෙන ඔය ණය අරන් තමා ඉන්නෙ. මහනායක ඇත්තෝ වරිග සභාවෙදි කියනවා නායක ඇත්තන් මොනවත් කරන්න එපා රැහේ අනිත් ඇයෝ බලාන ඉන්න කියලා. මට ඒ දේ කරන්න අපහසු තත්ත්වයක් දැන් තියෙන්නේ. මහවැලි නිලධාරින් අපිට අයිති අපේ කැලේට යන්න දෙන්නෙ නැහැ. පැණි කඩන්න, අල හාරන්න දඩයමක් කරන්න අපේ අයට කැලේට යන්න බැහැ. හේනක් කොටන්න ඉඩමක් නැහැ. අපිට ඉඩම් බෙදලා දෙන්නෙත් නැහැ. අපේ රැහේ ඇයන්ට නොදුන්නට වෙනත් අය කැලේ කපලා ඉඩම් අල්ලනවා.*



## හිඟ තිස්දාහට ලක්ෂයක් ගෙවන්න වෙලා

**උඟුරුවරිගේ අනුලාවතී**

මම දැන් ඉන්නේ හේනානිගල දකුණ. වයස අවුරුදු 42යි. කලින් හිටියේ දඹානේ. අපි පොඩි වයසෙ තමා මෙහේට ආවේ. මම LOLC එකෙන් ගේ හදා ගන්න කියලා ලක්ෂයක් ගත්තා. ගෙවාගෙන ගෙවාගෙන ගියා. අන්තිමේදි තිස්දාහක් විතර ගෙවා ගන්න බැරි වුණා. මහත්තුරු ලියුම් එවනවා. නඩුදානවා කියලා. මට දැන් තිස්දාහට පොලියත් එක්ක ලක්ෂයක් ගෙවන්න තියෙනවා.

මටත් අකුරු ලියන්න කියවන්න බැහැ. නම විතරයි ලියාගන්න දන්නේ. ෆෝම් එකක් දුන්නා අත්සන් කරන්න කියලා අපිත් කියන තැන්වල අත්සන් කළා. ඒකේ තිබුණෙ මොනවද කියලා අපි දන්නේ නැහැ. තියෙන්නේ මොනවද කියලා අපි ඇහුවෙත් නැහැ. ආපු මහත්තුරු කියලා දුන්නෙත් නැහැ. අවුරුදු දෙකහමාරකට ණය දුන්නේ. වාරිකේ ආවා අටදාහක්. පොලිය කොච්චරක්ද කියලා අපි දන්නේ නැහැ.

ගෙවාගෙන යනකොට හිතුණා, පොලිය වැඩියි දැන් ගත්තු ගානටත් වැඩිය ගෙවලා ඇති කියලා. අවසානේ ගොඩක් ප්‍රශ්න ආවා. අපේ මහත්තුරු හරියට රස්සාවක් කරන්නෙත් නැහැ. වැවේ තමා යන්නේ. වැවේ ජොබ් ඒක හරිගියේ නැති වුණාම එහේ මෙහේ වුණා. ගත්තු ගාණට සෑහෙන්න ගෙව්වා. අවසාන තිස්දාහට තමා ලක්ෂයක් එකතු වෙලා තියෙන්නේ.

දැන් නම් ලියුම් ආවට ගණන් ගන්නෙත් නැහැ. නඩු දැම්මත් කමක් නැහැ කියලා ඉන්නවා. නඩු දැම්මොත් යන්න වෙනවා. තිස්දාහට ලක්ෂයක් ගෙවන්න බැහැනේ කෝමත්.

එයාලා ආවෙම ණය දෙන්න බලාගෙන. බලහත්කාරයෙන් හරි ණය දෙනවා. අපිත් ඉතින් ගත්තා. පස්සේ බලන් යද්දි කරදරයක් තමයි ඉතින්. ආණ්ඩුවට කියන්න තියෙන්නේ මේ බැංකුවලින් ගත්තු ණය කපා හරින්න කියලා තමයි.



# අපිත් කරවිල ගෙඩියේ පණුවො වගේ

**ඌරු වරිගේ කරුණාරත්න**
හෙනානිගල ආදිවාසි ගම්මානය

ණය දෙන්න ආපු පළවෙනි දවසේ මම වැව් රස්සාවට ගිහිල්ලා හිටියේ. එදා මාළු අහුවුණෙත් නැහැ. මාළු කිලෝ පහක් වගේ තමා අහුවෙලා තිබුණේ. මම ඇවිදින් බලනකොට කොමර්ෂල් බැංකුවෙන් කියලා මහත්තුරු වගයක් ඇවිල්ලා අපේ බවලත් කට්ටිය හම්බවෙලා කතා කරලා තිබුණා. මං ඊට පස්සේ කොහොමද මේ ණය දෙන්නේ කියලා ඇහුවම සහන ක්‍රමයට දෙනවා කිව්වා. අපි අකුරු දන්නේ නැහැ. අපේ වාසගම ඌරු වරිගේ. ඇත්ත වශයෙන්ම කියනව නම් ඒකට යූ.ඩබ්. කියන්නෙ මොකද කියලවත් අපි දන්නේ නැහැ.

දවස් තුනකට පස්සේ ඒ මහත්තයෙක් ආවා. තුන්දෙනා තුන්දෙනා කණ්ඩායම් හදවලා තිබුණා. පනස්දාහක් ඉස්සෙල්ලම දුන්නා. ඒ පනස්දාහ ගෙවාගෙන ගියා. ඒක ගෙවලා ඉවර වුණාට පස්සේ මං ලක්ෂයක් ගන්න බැලුවා. ඊට පස්සේ කිව්වා හැටදාහක් දෙන්නනම් කියලා. මං ලක්ෂෙ ගන්න බැලුවේ ගේ හදා ගන්න මුල් අත්තිවාරම දා ගන්න කියලා. හැටදාහක් අරගෙන මදි. මම නෝනට කිව්වා, මේක අරගෙන අපිට වැඩක් නෑ, උවමනා දේ කරගන්න බැරිනම් කියලා. නෝනත් ඒකට කැමති වුණා.

අකුරු දන්නේ නැති අයගෙන් මේවට අත්සන් ගැනීම අසාධාරණ කමක්. මොකද අපේ නෝනලාට මේ ණය දුන්නට අපි දැනුවත් නැහැ. නෝනලාට තමා ඒ මහත්තුරු ඇවිදින් කියලා තියෙන්නෙ සහන ක්‍රමේට ගෙවාගෙන යන්න පුළුවන්, ණය ගන්න කියලා. අනේ මේ මෝඩ කට්ටියත් ඒකට හා කියලා. අපි බලනකොට මේ කට්ටිය අහුවෙලා ඒ බිල්ලට. අපි ඉතින් ගෙවාගෙන ගෙවාගෙන යනවා. පොලිය වැඩියි කියල තේරෙනවා. අපිට දැනීමක් නෑනේ මහත්තයා. කෝම හරි ගෙවාගෙන යන්නත් එපැයි මේක.

හදිසියේවත් නඩු දැම්මොත්- එහෙම කරන්න එපා කියලා තමා කියන්නේ. ඇත්ත වශයෙන්ම කියනව නම් අපි අනවසර කට්ටිය. ඉන්න තැනක් නෑ, යන්න තැනක් නෑ. අපි ජීවත් වෙන්නේ කුලී කරලා. එදිනෙදා ගිහින් වේල හොයාගෙන කන්නේ. ළමා ළපටි ඉස්කෝලේ යවා ගන්න ඕන. අපිත් දඟලන්නේ අපි මේ වැටිලා ඉන්න වළෙන් ගොඩ එන්නේ කොහොමද කියලා තමයි. දරුවෝ හරි අපිට අත දෙයිනේ කවදහරි ඉගෙනගෙන රස්සාවක ගියාම.

දැන් අපට කිසිම උද්ව්වක් නෑ රජයෙන්. මේ ළඟදින් නමදාහක් දුන්නා, සමෘද්ධිය තියෙන කට්ටියට. නැති අපට මුකුත්ම නැහැ. ආදිවාසි අයට කුඩම්මගේ සැලකිල්ලක් තමා තියෙන්නේ. මන්තිරිල ඉන්නවා දෙහිඅත්තකණ්ඩියේ, හෙනානිගල. අපෙන් ඡන්දෙ අරන් එයාල මන්තිරිලා වුණා. අන්තිමට ඒ කට්ටිය බලන්නෙත් නෑ. අපි කුලියෙන් ජීවත් වෙනව නම් අපිට මොකටද ඒ මන්තිරිලා? කතාවකට කියනවා මහත්තයෝ කරවිල ගෙඩියේ වැටෙන පණුවා ඒකම කනවලු, ඒකෙමලු මැරෙන්නේ. අන්න ඒ ටික තමා අපිට වෙලා තියෙන්නේ.

*මේ නිසා අපිට ජීවත්වෙන්න කුලී වැඩ කරන්න යන්න වෙලා"* ඔහු පවසයි.

## රජය මැදිහත් විය යුතුයි

මෙරට ආදිවාසී වැදි ජනයා ක්ෂුද්‍රමූල්‍ය නම් බාඳුරා ගොටුවේ ගොදුරක්ව අසරණ වී ඇතැයි පවසන ජාතික සහයෝගීතා සංවර්ධන පදනමේ සභාපති සුරංග රූපසිංහ වැඩිදුරටත් පැවසුවේ ක්ෂුද්‍රමූල්‍ය ණය වසංගතය සාමාන්‍ය ගොවි කම්කරු ජනයා පමණක් නොව මෙරට වැදි ජනයාද ආක්‍රමණය කර ඔවුන් දරිද්‍රතාවයේ අන්තයටම හෙළා ඇති බවයි.

*"මේක මහා භයානක තත්ත්වයක්. ක්ෂුද්‍රමූල්‍ය ණය අරන් ඒ ණයෙහි අසීමිත පොලිය සමග එන ණය වාරිකය ගෙවා ගන්න බැරි වුණාම දිවි නහගන්නයි වෙන්නෙ. මේ ආයතන ණය දෙන්නේ ඒ ණය නැවත අය කර ගන්න පුළුවන් තත්වයක ඉන්නවාද කියලා සොයා බලලා නෙවෙයි. ඒ නිසා මෙරට ගම්වල අන්ත අසරණ ගොවි ධීවර පවුල් ණය උගුලට හිරවෙලා අකාලයේ මියැදී තියෙනවා. ඒ තත්වය දැන් වැදි ජන ජීවිතවලටද බලපෑම් කිරීම ඛේදජනක තත්වයක්. හෙනානිගල, දලුකාන, පොල්ලෙබැද්ද වැනි වැදි ගම්වල ආදිවාසී කාන්තාවන් මේ වන විට ණය උගුලට හිරවෙලා අවසන්. මේ ආදිවාසි ජනයා අකුරු දන්නෙ නැහැ. ණය ගනිද්දි ගිවිසුම දැකලා නෑ, තියෙන්නෙ මොනවද කියලා දන්නෙ නෑ, නමුත් විශාල ණයක, අධික පොලියක ණය කාරයෙක් බවට පත්වෙලා. මේක භයානක තත්ත්වයක්. මේ තත්ත්වය දිගින් දිගටම පැවතුණොත් මෙරට දිළිඳු පවුල් තව තවත් දරිද්‍රතාවයේ අන්ත අගාධයටම වැටී ගිලී යාවි. ඒ නිසා මේ තත්ත්වය වළක්වන්න අපිට ගන්න පුළුවන් උපරිම පියවර ගන්නවා. අපි රජයට බල කරන්නේ මේ ක්ෂුද්‍රමූල්‍ය ණය කෙමන වහා පාලනය කරන්න පියවර ගන්න කියලයි"*

වැදි ජනයා මුහුණ දෙන මෙම කනගාටුදායක තත්ත්වය පිළිබඳව අවධානය යොමු කර නැගෙනහිර මුහුදු ආදීවාසී ජනයාට යම් සහනයක් ලබා දීම වෙනුවෙන් රජයේ නිලධාරීන් හා සාකච්ඡා කිහිපයකට එක්ව කටයුතු කළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂක ලයනල් ගුරුගේ මහතා පවසනුයේ ආදිවාසීන් කෙරෙහි ක්‍රියාත්මක මෙරට රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ ඛේදනීය තත්වයක් දක්නට හැකි බවයි. ඕස්ට්‍රේලියානු රජය එරට ආදිවාසීන් හට දක්වන ගෞරවය හා සැලකීම අප රටේ ආදිවාසීන්ට හිමි නොවීම තුළ ඒ බව මනාව පැහැදිලි වන බවයි.

## රැවටීමට ලක් වූ ප්‍රජාවක්

*"මහවැලි ව්‍යාපාරය ගොඩනැගීමත් සමග දඹාන හා ඒ අවට ගම්මාන වනජීවී අඩවි බවට ගාමිණි දිසානායක හිටපු ඇමතිවරයා විසින් පරිවර්තනය කළා. ඒ කාලයේ දී ඉතාම රැවටිලිකාර ලෙස තැපැල් බණ්ඩියා ප්‍රමුඛ කණ්ඩායමක් එකග කරවා ගත්තේ ප්‍රලාප රැසක් කියමිනුයි. ඔවුන්ට කැලයක් දෙනවා, නිවාස දෙනවා රැකියා දෙනවා කියමින් හෙනානිගල කණ්ඩායම අතරමං කළා. ඔවුන්ගෙන් කොටසක් ඒ කාලයේම යළි දඹානට පැමිණියා. ආදීවාසීන් කියන්නේ හැබෑවටම කැලයට ආදරය කරන කණ්ඩායමක්.*

*ඔවුන්ගේ ජීවිතය ඔවුන්ට නොදී උදුරාගෙන තියෙනවා. ආණ්ඩුව විසින් ඒක කළේ සංවර්ධනය මුවාවෙන් හා වෙන වෙන අණ පනත් මගින්. මේක මහා ඛේදවාචකයක්. එහි එක් ප්‍රතිඵලයක් ලෙස මොවුන් ණයෙහි ගොදුරු බවට පත්ව තියෙනවා. ඒ ඔවුන්ට ඉඩම් අහිමි වීම හා මසුන් ඇල්ලීමට හෝ කිසිවක් නොමැති වීමේ ප්‍රතිඵලයක් නිසා ඔවුන්ට ස්ථිර රැකියාවක් නැහැ. රැකියාවක් කිරීමට සුදුසු අධ්‍යාපනයක් නැහැ ඔවුන් කොටින්ම අකුරු දන්නෙ නෑ. ඒ නිසා ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල පහසු ගොදුරක් බවට මේ අය පත්වෙලා. ක්ෂුද්‍රමූල්‍ය ණය ඉතා වටිනා ක්‍රමවේදයක් වුණත් මේ මූල්‍ය සමාගම්වලට කිසිදු විනයක් නැහැ. ඒකයි මේ ගැටලුවේ ප්‍රධානම කාරණය වන්නේ. මේ සමාගම් මහ බැංකුව නිසි ලෙස නියාමනය නොකරන නිසාත් මුදල් අමාත්‍යාංශය මේවාට සුදුසු අණ පනත් නොගෙනෙන නිසාත් මේ අය මේ හිදැස ප්‍රයෝජනයට ගනිමින් ලංකාව තුළ මෙය අවභාවිත කරනවා. මේ නිසා ආදිවාසීන් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු රාජ්‍ය ප්‍රතිපත්ති මීට වඩා පළල් විය යුතුයි ඒ සඳහා අණ පනත් ගෙන ආ යුතුයි. ඒ වගේම වැදි ජන සමාජය හා සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමට පළාත් සභාවන් තුළ ද ක්‍රමවේදයන් සැකසිය යුතුයි. මහ බැංකුව හා මුදල් අමාත්‍යාංශය වහා මැදිහත් වී සාධාරණය ඉටු කළ යුතුයි."*

අපේ මුල් පරපුරට නෑකම් කියන මේ මිනිස් ගජ්ජුන් මංගැච්චූ රුකුල් පොජ්ජවල් රැක දී ඔවුන්ගේ යාතුකර්ම හා සංස්කෘතිය තවදුරටත් ආරක්ෂා කර දීම අප සතු යුතුකමක් නොව වගකීමකි. එවිට ඔවුන් සිය පාරම්පරික වන බිමෙහි සුවඳ විඳ යළි ස්වාධීනව නැගී සිටිනු ඇත. දුණු හී නැතත් නෑ යකුන් පුදා කුක්කන් ඇන්න කටපයියං සොයා දඩයමේ යනු ඇත. බඹර වදද, මී වදද කඩා අපට දෙනු ඇත. එවිට ඔවුන්ව ක්ෂුද්‍රමූල්‍ය බාඳුරා ණය ගොටුවට ගොදුරු කර ගැනුමට සමාගම්වලට ද නොහැකි වනු ඇත.

# ගනුදෙනුකරුවන් මතු කරන ගැටලු ගැන ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල ප්‍රතිචාරය

මෙම අධ්‍යයනයේදී ණය ලාභීන්ගෙන් ඉදිරිපත් වූ ගැටලු සහ සමස්තයක් වශයෙන් ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රය තුළ මතු වී තිබෙන අර්බුදය සම්බන්ධයෙන් ක්ෂුද්‍රමූල්‍ය හෝ කෙටිකාලීන ණය පහසුකම් සපයන ආයතනවල ප්‍රතිචාරයද මේ සමග පළ කිරීමට අපි උත්සායක නිරත වුණෙමු. එසේ වුවද අප අපේක්ෂා කළ කාල සීමාව තුළ එය ඉටු කර ගැනීම දුෂ්කර විය.

මේ සම්බන්ධයෙන් අප විසින් කොමර්ෂල් ක්‍රෙඩිට් ආයතනයෙහි විධායක අධ්‍යක්ෂවරයකු වන පී. එස්. ආර්. සී. චිට්ටි මහතා සමග මාර්ගගත සාකච්ඡාවක් ආරම්භ කරන ලද අතර වැඩිදුර අදහස් ලබා දීම සඳහා මුහුණට මුහුණ සාකච්ඡාවක් ලබා දීමට ඔහු එකඟ විය.

එමෙන්ම එල්.ඕ.එල්.සී. ආයතනයෙහි අදහස් විමසීම සඳහා ඉල්ලීමක් සිදු කරන ලද අතර ඒ සම්බන්ධයෙන් මේ වනතෙක් ප්‍රතිචාරයක් ලැබී නොමැති වුවද ඉදිරියේදී ඊට අවස්ථාවක් ලැබෙනු ඇතැයි සිතමු.

ක්ෂුද්‍රමූල්‍ය හෝ කෙටිකාලීන ණය පහසුකම් සපයනු ලබන බොහෝ ආයතනයන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයන්ගේ සංගමයෙහි සභාපති අනුර අතපත්තු මහතා සමග සාකච්ඡාවක් සඳහා ඉල්ලීමක් කර ඇති අතර ඒ සඳහා ඉදිරි දිනයක අවස්ථාවක් ලබා දෙන බවට එකඟ වී ඇත.

ක්ෂුද්‍රමූල්‍ය හෝ කෙටිකාලීන ණය පහසුකම් හා බැඳි සේවාවන් සපයන්නන්ගේ පාර්ශ්වය වෙනුවෙන් අදහස් දැක්වීමක් ලැබුණු පසු ඔවුන්ගේ අදහස්ද අපගේ ප්‍රකාශන ඔස්සේ මේ පරිද්දෙන්ම ජනගත කිරීමට කටයුතු කරමු.

**සංස්කාරක**

VOICE OF CITIZENS

CENTRE FOR POLICY ALTERNATIVES

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

www.facebook.com

www.twitter.com

www.youtube.com